# මහාමායා මව් තුරුලේ වසර දහතුනක්



ඩිනෙත්මි උමායා වීරසූරිය

කෘතියේ නම :- මහාමායා මව්තුරුලේ වසර දහතුනක්

කතෘගේ නම :- ඩිනෙත්මි උමායා වීරසූරිය

කතෘගේ වෙනත්කෘති :- සිහිනය සහ ගුරුවරයා

:- වෙන්වීමේ දුක හා ලැබීමේ සතුට

දිනය 2023.11.15

ISBN – 978-624-208-093-2

**පිදුම**

දහතුන් වසරක් පුරාවට

මා හට  සිප්සතර කියාදුන්

ආදරණීය ගුරු මෑණිවරුන්ටත්

ගුරු පියවරුන්ටත්

මෙම ග්‍රන්ථය

උපහාරයක් වේවා.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

## පටුන

1. පාසල් මව් තුරුලේ ගෙවුණු පළමු වසර

2. දෙවන ශ්‍රේණිය

3. තුන්වන ශ්‍රේණිය

4. හතරවන ශ්‍රේණිය

5. ප්‍රාථමික අංශයේ ගෙවූ අවසන් වසර

6. හය වන ශ්‍රේණිය

7. හත් වන ශ්‍රේණිය

8. අට වන ශ්‍රේණිය

9. ජිවිතයේ හැරවුම් ලක්ෂය

10. 10 වන ශ්‍රේණිය

11. පළමු  කඩයිම් විභාගය හා ගෙවුණු අපුරු වසරක්

12. පුහුණු ශිෂ්‍ය නායිකාවක් ලෙස භාර ධුර වගකීමක්

13.මං දැන් මාහාමායාවේ කනිෂ්ඨ ශිෂ්‍යනායිකාවක්

14.මහාමායා මව්තුරුලේ ගෙවන අවසන්  වසර දිත්වය.

15.  පාසලේ වායු රයිෆල හා පිස්තෝල වෙඩිතැබීමේ කණ්ඩායමේ කණ්ඩායම් නායිකාව

16.පාසලේ ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයේ සාමාජිකාවක්

17. ධුරකාලයේ නිමාව හා පාසල් දිවියේ අවසන් දින කිහිපය.

## පළවන ශ්‍රේණිය

මවගේ තුරුලේ පහස විදිමන් සිටි මා මහාමායා මව්තුරුලට මුලින්ම පා තැබූ දින අදටත් මා සිහි කරන්නේ ඉතාමත් සෙනෙහසිනි. පුංචි රෝස මලක් අතට දී 2 ශ්‍රේණියේ සහෝදරියන් අපව පිළිගත්තා. රතු රෝස මල් අනිත් අයට හම්බ වෙද්දි මට හම්බ වුනේ කහ පාට රෝස මලක් මාව පිළිගත්ත පුංචි අක්කිට එදා මට මල දෙන්න බෑ හිතුනා. මේක දැකපු එවකට සිටිය විදුහල්පතිනිය ඇගේ නිළ නිවසට ගොස් මට පුංචි කහ පාට මලක් ගෙනත් දුන්නා. එකත් අරන් මම පන්තියට යනකොට මට මහ පාළුවක් දැනුනා. මං ආපහු හැරුණා අම්මා දිහාවට අම්මාත් අඬනවා ඒත් මගේ දිහා බලාගෙන අතවනනවා. අඬ අඬාම මං පන්තියට ගියා. පන්තියේ ඉස්සරහා පන්ති භාර ගුරුතුමිය හිටියා. එයා හරියට අපේ අම්මා වගේ. මට එහෙම හිතුණා. ඇය නමින් නිරෝෂා මැඩම් ලස්සන පාට පාට සාරි අදින ලොකු කොණ්ඩයක් බදින චාම් ගති පැවතුම් තියෙන අහිංසක හිනාවකින් අප පිළිගත්තා. ආදරණිය චරිතයක් පෙර පාසලේ මා දුටු ගුරු භූමිකාවෙන් හාත්පසින්ම වෙනස් වූ ගුරු භූමිකාවකට මා කෙමෙන් කෙමෙන් පුරුදු වුවා පමණක් නොව මා ආදරය කිරීමටත් පටන් ගත්තා. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු කළ මා හට සිංහල මාධ්‍යට හා රටාවට හුරුවීමට ටික කාලයක් ගත වුණා. මේ හැම කලබලයක්ම අස්සේම එක වසර නිමා වුණා.

## දෙවන ශ්‍රේණිය

පාසල් මිතුරුලේ ගෙවන දෙවන වසර මෙයයි. දෙවන වසරේදීත් පංතිභාර ගුරුමෑණිය වුයේ අපේ නිරෝෂා මැඩම්.

දෙවැනි වසරේදි මං තවත් එක් ආදරණිය ගුරුමෑණියක් හමුවුණා. ඈය මාගේ ඉංග්‍රීසි ගුරුමෑණියයි. ඈය ඉතාමත් ආදරණිය ගුරුමවක් ඈය මා ඈමතුවේ මගේ චණ්ඩි කෙල්ල කියාය. පාසල් පිවිතයේ අමතක නොවන ගුරුමෑණිවරු ගුරුපියවරු අතරේ එක් ප්‍රධාන චරිතයක් ලෙස මාගේ ඉංග්‍රීසි ගුරුමෑණිය වු චන්දනී ගුරුමැණියන්ව හඳුන්වා දිමට පුළුවන්.

වාර්ෂික විවිධප්‍රසංගයට මුළු ප්‍රථමික අංශයම සුදානම් වු අයුරු මා මතකයට නැගේ. රන් ටිකිරි සිනා මුව මුව පාලා ලංවී අත් අල්ලාගෙන ඇස් දැල්ලුවා .... ගීතයට බැලේ නර්ථනයක් ඉදිරිපත් කල අයුරු මගේ මතකයට නැගේ.මෙම නර්ථනය පුහුණු කලේ කුමුදු මැඩම්. ඈය අපේ අසල්වැසියා ලෙස අප නිවසට අල්ලපු ගෙදර පදිංචියට පැමිණිම පිවිතයේ මාහට ලැබුණු තවත් සුවිශේෂි අත්දැකිමකි.

දෙවැනි වසර වන විට අපි පාසලට ඉතාමත් සමීප විය. එසේ පාසලට අප සමීපවිමට ප්‍රධානතම හේතුව වුයේ අප පංතිභාර ගුරුතුමියයි. අප අතර වු යම් යම් ගැටලු අපට නොදෙනේන විසඳපු ආකාරය ගැන මතක් කල යුතුයි.

මං ටිකක් දඟ චරිතයක් නිසා නිතරම මැඩම් මට අවවාද කලා දඟ කරන්න එපා කියලා. සමහර වෙලාවට මැඩම් චුට්ටක් සැර වෙනවා මට සැර කලාට ආයෙත් මගෙ ඔලුව අතගාලා මැඩම් කිව්වේ හොඳ ළමයෙක් වෙන්න දිනෙත්මී කියලා. මැඩම්ගේ ඒ ආදරණිය වචන වලට මං හරිම ආදරෙයි. මැඩම් එක්ක අවුරුදු 2ක් පුරාවට අපි ආදරයෙන් කාලය ගත කලා. ඉස්කෝලේ කියන්නේ කොයි වගේ තැනක් ද?. අපි කොහොමද ඉන්න ඕනේ කියන දේ අපිට මුලින්ම කියලා දුන්නේ මැඩම්. මට මුලින්ම අකුරු ඉගැන්වුවෙත් මැඩම්. මැඩම් අද වෙනකොට අපේ පාසලෙන් අස්වෙලා ස්ථාන මාරුවිමක් ලබාගෙන අප සහෝදර පාසල වන මහනුවර ධර්මරාජ විද්‍යාලයේ සේවය කරනවා. මැඩම්ගේ ආදරණිය සිනාව හැමදාමත් අපේ මතකයේ රැදි තියෙනවා මැඩම්.

## 3 වන ශ්‍රේණිය

මහාමායා මව්තුරුලේ 3 වන වසරටත් පා තැබුවෙමි. පළමු වසර දෙක තුල මා හට තිබුණේ මහත් වූ ගට්ටනයකි මන්ද යත් පෙරපාසලේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරූ මට සිංහල මධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු කිරිමට මදක් අපහසු වූ බැවිනි. 3 වන ශ්‍රේණියට පා තැබූ පළමු දින මාගේ දෑසින් කදුලු ගලන්නට පටන් ගත් අවස්ථාවේදි මා අවුරුදු දේත්වයක් පුරාවට නිරෝෂා ගුරුතුමියගේ පහස විදිමින් සිටිය කාලයත් ඇයට කොයිතරම් ආදරේයිද යන්නත් එතුමිය දමා යෑමට මාගේ හිතේ ලෝබකමක් ඇතිබවත් පුංචි හිතට දැණුනු අවස්ථාව මා සිහිපත් කළයුතුමයි.

3 වන ශ්‍රේණියේදි මාගේ පංතිභාර ගුරුමෑණිය වුයේ චිත්‍රා ගුරුමෑණියයි. ඇයත් මාහට ඉතාම ආදරණිය ගුරුමවක් වුවා. ලස්සන ලස්සන පාට පාට සාරි ඈ හට තිබුනේය. එමෙන්ම සුන්දර සිනහවකි. සුන්දර සිනහවක් සමඟ ඇය අපව පන්තියට පිළිගත් ඒ අපුරු දවස අදටත් මා සිහිකරන්නේ ඉතාමත් සෙනෙහසකිනි.

අප දෙමළ විෂය මුලින්ම ඉගෙන ගන්නේ 3 වන ශ්‍රේණියේදිය. අපට දෙමළ විෂය ඉගැන්වුයේ සංද්‍යා රණවීර ගුරුමෑණියයි. ඇය කියා දුන් පුංචි දෙමළ ගීයක් මා මතකයට නැගේ.

නිලා නිලා වාවා....

නිල්ආමල් ඕඩිවා.....

මලේ මෙල් ඒලිවා......

මල්ලි හෙප්පු කොණ්ඩිවා..

ඒ අපේ මැඩම් අපිට පුංචි කාලේ කියාදුන් එක දෙමළ ගීතයක්.

සංද්‍යා මැඩම්ව හමුවිමත් මාගේ පාසල් පිවිතයේ ආදාරණිය සිදුවිමක්. පළමු වන වසර තුල මාතුල තිබු ගට්ටනය චිත්‍රා මැඩම්ගේ භූමිකාව තුලින් ටිකෙන් ටික මඟහැරි යන්නට විය. එමගින් මගේ අධ්‍යාපන කටයුතු ඉතා පහසුවෙන් කරගෙන යාමට මඟ පෑදුණි.

පංතියේ මිතුරියන් සමඟ ඇතිවන වචන හුවමාරු වලින් මතුවු පුංචි ගැටලු අපට නොදැනෙන්ම මැඩම් විසදපු ආකාරය ගැන සිහිපත් කල යුතුයි. කිසිම කෙනෙකුට වෙනසක් නොදැනෙන්න මැඩම් ඒ හැම දේම විසඳුවා. අපිව ආරක්ෂා කලා.

අපේ විවිධප්‍රසංගය සඳහා අපි නැටුවේ ජපන් සින්දුවකට ජපන් නැටුමක් ඒක නම් කවදාවත් අමතක වෙන්නේ නෑ. මට මතකයි නැටුම වේලාවේ දි මගේ ජපන් කුඩේ සංජනා ගත්තා කියලා මං හොඳටම ඇඩුවා. තුන වසරට ගියත් ඉඳලා ඉඳලා නිරෝෂා මැඩම්ව බලන්න යන්නත් අපි අමතක කලේ නෑ.

ටිකක් දඟ කලාම චිත්‍රා මැඩම් අපිට ටිකක් සැර වුනා. ඒත් මැඩම්ගේ ආදරේනම් කවදාවත් අඩු වුනේ නෑ. ඊලඟට යන්නේ 4 පංතියට වුණාට අපිට එකලොකුවට දැනුනේ නෑ. මොක ද චිත්‍රමැඩම් අපිත් එක්ක 4ට යන නිසා.

මේ විදිහට 3 වෙනි වසරත් සුන්දර මතක එකතු කරමින් නිමා විය.

## 4 වන ශ්‍රේණිය

චිත්‍රා මැඩම් එක්ක අපි හතර වසරට ආවා ලබන අවුරුද්දේ ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන්න තියන නිසා වෙනදාට වඩා වැඩ නම් ටිකක් වැඩි වුණා. අපිට අවුරුද්ද පුරාවටම ප්‍රශ්න පත්‍ර කරන්න වුණා. සෙල්ලම් නම් ටිකක් අඩු කරන්න වුණා මේ අවුරුද්දේ.

"දිනෙත්මි.... ඔයාගේ දඟ වැඩනම් දැන් අඩු කරන්න වෙයි."

කියලා චිත්‍රා මැඩම් නිතරම මට අවවාද කලා. පංතියේ හිටියට මගේ හිත තිබ්බෙම ක්‍රීඩා පිට්ටනියේ. කියලා මැඩම් හොඳටම තේරුම් අරන් හිටියේ. ඒ නිසා මැඩම් මට නිතරම අවවාද කලා. මැඩම් මට සැර වුණා. වෙනදාට වඩා.

මේ දවස්ටිකේම අපි කලේ ප්‍රශ්න පත්‍ර ලියන එක මෙහෙම ටික දවසත් ගත වුණා. මුල් අවුරුදු වල වගේ නොවෙයි දැන් අපිට ටිකක් තේරෙනවා හැමදේම යාළුවෝ එක්ක එකට එකතු වෙලා වැඩ කරන්න, බෙදා හදාගෙන වැඩ කරන්න අපිට දැනුම් තේරුම් ගන්න පුළුවන් වුනා.

ඊළඟ අවුරුද්දේ පහේ පංතියට යන්න වෙන්නේ චිත්‍රාමැඩම්ව දාලා කියලා මතක් වෙනකොටත් හරි දුකයි. අපි මැඩම්ට ගොඩාක් ආදරෙයි. කොහොමින් කොහොම හරි මේ වැඩ ඔක්කොටම අස්සේ 4 වසරත් ඉවර වුණා.

## ප්‍රාථමික අංශයේ ගත කල අවසන් වසර

5 වසර කියන්නේ ප්‍රාථිමික අංශයේ අපි ගෙවපු අන්තිම අවුරුද්ද ඒ විතරක් නොවෙයි අපි තමයි දැන් ප්‍රාථමික අංශයේ අක්කලා ඒ ගැන අපි හරිම ආඩම්බරයෙන් තමයි හිටියේ. චිත්‍රා මැඩම්ව දාලා එන්න වුණ එක ගැන හිතේ තිබුණේ ලොකු දුකක් ආයෙත් මැඩම් ලඟට දුවලා යන්න මට හිතුනා.

5 වන ශ්‍රේණියේ දි අපේ පංති භාර ගුරුතුමිය වුනේ හද්‍රා මැඩම් මැඩම් හරිම ලස්සනයි. මැඩම් හරි ලස්සනට ඔසරි අදිනවා. මැඩම් ඔසරි අදින විදිහට මං හරිම ආසයි. මැඩම් ටිකක් සැරයි. නිරෝෂා මැඩම්, චිත්‍රා මැඩම් දෙන්නාටම වඩා ටිකක් සැරයි.

ටික දවසක් යනකොට අපි මැඩම්ට ගොඩාක් සමීප වුණා. පුංචි කාලේ වගේ ගොඩක් දඟවැඩ කලේ නෑ. ඒත් සමහර වෙලාවට මැඩම්ට තරහා යන වැඩ කරලා තියෙනවා. මැඩම් ඒ හැම වෙලාවේම මට හරිම ආදරයෙන් අවවාද කලා.

ප්‍රාථමික අංශයේ හිටපු ලොකු අක්කලා අපි නේ ඒ නිසා පුංචි නංගිලාට ආදර්ශමත්ව ඉන්න ඕනේ කියලා අපේ මැඩම් අපිට නිතරම කිව්වා.

5 වසරේදි තවත් එක් අපුරු අවස්ථාවක් අපට ලැබුණා.

ඒ තමයි පළවෙනි වතාවට විද්‍යාලයේ පෙරදිග තූර්යවාදක කණ්ඩායමක් නිර්මාණය කලා. මටත් එහි සමාජිකාවක් වෙන්න අවස්ථාව ලැබුණා. මම වාදනය කලේ දවුල ක්‍රීඩා උත්සවයේ ප්‍රථම වතාවට තමයි. පෙරදිග තූර්යවාදක කණ්ඩායමට මට දක්ෂතා පෙන්වන්න අවස්ථාව දුන්නේ ප්‍රාථමික අංශයේ එතරම් ලොකු මතක ගොඩාක් මාතුල ඇති වුනේ නෑ. මගේ ආදරණීය ගුරු මෑණිවරුන්ගේ අවවාද ආදරය මගේ හිතේ නොමැකි තිබුණා අදවෙනකම්ම.

අවුරුදු 5ක්ම ගෙවුණා දැනුනේවත් නෑ. 6 වසරට පා නගන්නට තමයි අපි සුදානම් වෙන්නේ ශිෂ්‍යත්ව විභාගයත් ඉවරයි නේ. අපි සෙල්ලමින්ම කාලය ගත කලා.

ප්‍රාථමික අංශයෙන් ද්විතික අංශයට යන්න ලොකු ආසාවක් තිබුණා. මට මේ කලබල අස්සේ වසර පහක් ගෙවුනා නොදැනිම.

## 6 වන ශ්‍රේණිය

ප්‍රාථමික අංශයේ සිප්සතර හදාරා ද්විතික අංශයට පැමිණීමට තිබුනේ විශාල ආශාවකි.

ප්‍රාථමික අංශයේ දි අපි ලොකු අක්කිලා වුනාට ද්විතික අංශයේ අපි චුටිම නංගිලා වුණා. මගේ දඟවැඩනම් ගොඩාක් අඩු වුණා මොක ද ප්‍රාථමික අංශයේ වගේ නෙමෙයි මෙහි ශිෂ්‍ය නායිකාවෝ ඉන්නවා. වේලාවට පන්තියට යන්න ඕනේ. ගොඩාක් වේලාවට සෙල්ලම් කර කර ඉන්ඩ බෑ, පිළිවෙලට ඉන්න ඕනේ වෙනසට හුරු වෙන්න නම් ටික කලක් ගත වුණා.

6 වන ශ්‍රේණියේ දි මාගේ පංතිභාරගුරුමෑණිය වුනේ ගීතා සෙනවිරත්න ගුරුමෑණියයි. ඇය අපට ඉගැන්නුවේ ගණිතය විශයයි. ඇය හරිම කරුණාවන්ත ආදරණීය ගුරු මවකි. හැමෝටම දිනෙත්මි වු මා ඇයට උමයා විය ඇය මා ඇමතුවේ මගේ දෙවන නමින්. මින් පෙර කවුරුවත් මාගේ දෙවන නමින් මා ආමන්ත්‍රණය කරලා තිබුණේ නෑ. ගීතා මැඩම් මගේ හිතේ අමතක නොවන ආදරණීය ගුරු මවක් වෙන්නටත් ඒක හේතුවක් වුණා කියලා මං හිතනවා.

5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගෙන අප පාසලට නවක ශිෂ්‍යාවන් රාශියක් අප හා එක්වුණා. අලුත් පරණ භේදයකින් තොරව ඔවුන්ව ආදරයෙන් පන්තියට පිලිගත් අපි ඔවුන් සමඟ සහයෝගයෙන් වැඩකලා, සහයෝගයෙන් වැඩ කරන්න අපිට කියලා දුන්නේ අපේ ගීතා මැඩම්.

ප්‍රාථමික අංශයේ වගේ නෙමෙයි ඉස්කෝලේට ආදරේ කරන්න පටන් ගන්නේ ද්විතික අංශයට ආවට පස්සේ ද්විතික අංශයේ දි අපිට කැමති සෞන්දර්ය විශයක් හදාරන්නට අවස්ථාව ලැබුණා. මන් තෝර ගත්තේ පෙරදිග සංගීත විෂයයි. පෙරදිග සංගීත අංශය මගින් වාර්ෂිකව සංවිධානය කරන ලද භක්ති ගී ප්‍රසංගය හා වාද්‍ය වෘන්දයට එකතු වෙන්නට මට අවස්ථාව ලැබුණා. ද්විතික අංශයට ආපුගමන් මුලින්ම සම්බන්ධ වුනේ සංගිත අංශයේ වැඩ කටයුතු වලටයි.

ප්‍රාථමික අංශයේ වගේ නෙවෙයි ගොඩාක් උත්සව මෙහි යෙදිලා තියෙනවා. විවිධ සමිති සමාගම් වල උත්සව ගොඩාක් වෙලාවට සංවිධානය වෙනවා මටත් ගොඩාක් ආස හිතුනා සමිති සමාගම් වලට සම්බන්ධ වෙලා වැඩ කරන්න. ප්‍රාථමික අංශයට වඩා හරිම වෙනස් පරිසරයක් තමා පෙනෙන්න තියෙන්නේ ශිෂ්‍යනායක අක්කලා තමයි අපිව මෙහෙයවුයේ. අක්කලා අපේ අඩුපාඩු පෙන්නලා දුන්නා. උදේට ගේට්ටුවෙන් ඉස්කෝලේ ඇතුළට එනකොට බෑග් එක චෙක් කරනවා. එතකොට අපේ නිල ඇඳුම් පිළිවෙලට තියනවාද කියලා අක්කිලා උදේට බලනවා පංතිභාර මැඩම්ලා පන්තියට එනකම් අක්කිලා අපිව බලාගන්නවා. ගීතා මැඩම් අපිට හැම වෙලේම කිව්වේ පංතියේ වැඩ වගේම බාහිර වැඩත්කරන් කියලා. එහෙම කරනවට මැඩම් ගොඩාක් කැමති වුණා. ඒවගේම මැඩම් අපිට නිතරම ඒ දේවල් වලට යොමුකලා. මැඩම් එක්ක ඉන්නකොට ද්විතික අංශයටත් ටික ටික අපි හුරු වුණා.

6 වන වසරක් හෙමින් හෙමින් ගෙව්ලා ගියා.

## 7 වන ශ්‍රේණිය

ගීතා මැඩම්ව දාලා 7 ශ්‍රේණියට යන්න වුණා 7 පංතියේ පංතිභාර ගුරුමෑණිය වුනේ පද්මාදේවි නවරත්න ගුරුමෑණියයි. ඇයත් ඉතාමත් කරුණාවන්ත ගුරු මවක් ඇයට තිබුණේ ලස්සන කටහඩක් මැඩම් අපිට ඉගැන්නුවේ විද්‍යාව විෂය. අපේ පංතිය තමයි ශ්‍රේණියේ හොඳම පංතිය කියලා හැමෝම කිව්වා. මැඩම් කවදාවත් අපිට සැර වුනේ නෑ. පුංචි කාලේ තරම් දඟවැඩ කලේ නැති නිසා මැඩම්ට මට සැරවෙන්න වුනෙත් නෑ. මැඩම් දඟ ළමයින්ට තමයි ගොඩාක්ම ආදරේ කියලා මැඩම් කියලා තියනවා. මැඩම් පොඩිකාලේ හරි දඟයි කියලත් මැඩම් අපිට කියලා තියනවා. 7 වසරේදි අපි අධ්‍යාපන චාරිකාව ගියේ පුත්තලම නගරයට

එදා අමතක නොවන දවසක් වුණා. අපි හැමෝම මැඩම්ගේ සාරි පොටේ එල්ලිලා මැඩම්ගේ පිටිපස්සෙන් තමයි අපි ගියේ. බස් එක දෙවනක් වෙන්න කෑ ගසමින් සිංදු කියමින් විනෝද වුණු හැටි මා මතකයේ රැඳි තිබේ.

7 වන ශ්‍රේණියේ දි මට තවත් ආදරණිය ගුරු මවක් හමුවුණා.ඒ තමයි උචිතා මැඩම් ඇය අපිට සිංහල විෂය උගන්වන ගුරුමෑණියයි. මැඩම්ගේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. වායු රයිෆල් හා පිස්තෝල වෙඩි තැබිම මහාමායාවෙන් ආරම්භ කරන්න මැඩම් මගේ ක්‍රිඩාවට මාව තවත් උනන්දු කලා කවදාහරි ඉස්කෝලේ මේක පටන්ගන්නට ඕනේ කියලා මැඩම් කිව්වා. මැඩම්ගේ ඒ ආදරණිය වචන ටික මට ලොකු ශක්තියක් වුණා. මැඩම් එහෙම කිව්වාම මට හිතුණා කවදාම හරි මේ ක්‍රිඩාව අනෙක් සහෝදරියන්ටත් හදුන්වලා දෙන්න ඕනේ කියලා. මැඩම්ගේ ආදරණිය සිතුවිලි වලට ඒ වචන වලට මට හැමදාමත් ආදරෙයි ඒ වචන හැමදාමත් මගේ හිතේ කෙටිලා තියනවා.

LMDS කියලා ලස්සන උත්සවයක් ද්විතික අංශයේ තිබුණා. එදා අපි හැමෝම අදින්න ඕනේ පාට ගවුම් ටිකක් දිලිසෙන පාට ගවුම් අදින්න අපිට අවසර ලැබුණා. ඒක පවත්වන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් එහි තරගයෙන් දිනන අය අගය කරන්න ඔවුන්ට ත්‍යාග සහතිකපත්‍ර ලබා දෙන්න වගේම පුංචි අපේ දක්ෂකම් පෙන්වන්න ඉංග්‍රීසි දැනුම වැඩි කරගන්න මේක ලොකු අවස්ථාවක් වුණා.

ප්‍රාථමික අංශයේ වගේ නෙවෙයි එක එක සමිති සමාගම් වලින් කරන වැඩගොඩක් අපිට මෙහිදි ඉගෙන ගන්න පුළුවන් වුණා.

අපේ පද්මාදේවි මැඩම් එක්ක මේ අවුරුද්දත් නොදැනිම ගෙවිලා ගියා.

# 8 වන ශ්‍රේණිය

8 වැනි වසරේදි මගේ පංතිභාර ගුරුමෑණිය වුයේ මනෝරි ධර්මරත්න ගුරුමෑණියයි. අපේ මැඩම් කොණ්ඩේ ලස්සනට පිරලා කොණ්ඩේ බැදන් එනවා. අපේ මැඩම් ඔසරියට හරිම හැඩයි. මැඩම් හැමදාම උදේට අපේ කොණ්ඩේ පිළිවෙල ගැන බැලුවා. තෙල්ගාලා අවේ නැති දාට පන්තියේ පහනට දාන්න ගෙනාපු තෙල් ගාලා මැඩම් අපේ කොණ්ඩේ පිරනවා. කොණ්ඩේ කන ළඟට කරලා තදට ගොතලා තියනවද කියලත් බලන්න මැඩම් අමතක කලේ නෑ. කොහේ හිටියත් මැඩම් පංතියට එනකොට අපි පංතියේ ඉන්න ඕනේ.. පහන පත්තු කරලා පංතිය අතුගාලා පිරිසිදුව තියෙන්න ඕනේ ඒවා තමයි අපේ මැඩම්ගේ පුංචි පුංචි නීති වුණේ. ඒවා ඒ දවස් වල අපිට නීති වුනාට දැන් තේරෙනවා ඒ හැමදේම මැඩම් එහෙම කලේ අපිට ගැහැණු ළමයෙක් විදිහට පිළිවෙලට ඉන්න උගන්වන්න කියලා.

අපි මැඩම් එක්ක කාලය ගත කරපු විදිහ මැඩම් ටිකක් සැර වුණාට අපිට එක දැණුනු විදිහ අදටත් මතකයි.

තවත් ආදරණිය වසරක් ඒ විදිහට ගෙවිලා ගියා.

## **<u>ජීවිතයේ හැරවුම් ලක්ෂය</u>**

මගේ ජීවිතය නවමු මානයකට ගෙනයන්නට මේ අපූරු වසරට හැකියාව ලැබුණා. මේ වසරේදි මගේ පංතිභාර ගුරු මෑණිය වුයේ අනෝමා මිදෙණිය ගුරුමෑණියයි. මැඩම් සැරයි ඒත් හරිම ආදරණියයි. මැඩම් කැමැති පිළිවෙලට වැඩකරනවට. ගැහැණු ළමයෙක් වුණාම සංවරව කතා කරන්න සංවරව හැසිරෙන්න , සංවරව වාඩි වෙන්න පිළිවෙලට කන්න බොන්න ඉගෙන ගන්න ඕනේ කියලා මැඩම් අපිට නිතරම කියලා දුන්නා. මගේ පංතිභාර ගුරුමෑණියගේ සිතුම් පැතුම්,චර්යා රටාව ,ගතිගුණ මගේ ජිවිතය වෙනස් කරන්නට නවමු මානයකට යොමු කරන්නටත් හේතු විය.

එසේම මේ කාලයේ අපේ පාසලේ උප ප්‍රධාන ශිෂ්‍යනායිකාව වශයෙන් කටයුතු කල ගයත්‍රි ඒකනායක අක්කීට තිබුනේ කාටවත් නැති හරි අපූරු පෞර්ෂත්වයක්, ඒ වගේම අක්කිට ඕනෑම පිරිසක් පාලනය කරගැනිමේ හැකියාව තිබුණා. අක්කි හරිම පිළිවෙලයි. හැම අතින්ම අක්කි සම්පූර්ණයි තැනට ගැළපෙන විදිහට අක්කි වැඩ කරන්න දන්න කෙනෙක්, අක්කිට ලස්සනට කතා කරන්නත් පුළුවන් මේ හැම දේයකින්ම මට කියන්න හැදුවේ අක්කි හැම අතින්ම සම්පූර්ණයි කියලා. අක්කි වැඩ කරන විදිහ,අක්කිගේ පෞර්ෂත්වය දැක්කාහම මමත් හිතාගත්තා කවදාහරි ශිෂ්‍ය නායිකාවක් වෙනවා කියලා.

අක්කි දිහා බලලා මා මගේ අඩුපාඩු ගොඩාක් දුරට අවම කරගත්තා කියලත් මං විශ්වාස කරනවා.

මේ අවුරුද්දේ මට විශේෂ අවස්ථාවක් ලැබුණා ඒ තමයි පෝලන්තයේ පැවැත්වෙන වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබිමේ තරඟාවලියට සහභාගි වන්න මට අවස්ථාව ලැබුණා. මුළු මධ්‍යම පලාතෙන්ම ඊට තේරීපත් වුණ එකම කෙනා විමත් කණ්ඩායමේ ලබාලතම ක්‍රිඩිකාව මම විමත් සුවිශේෂි වුණා. මෙම තරඟයෙන් ජයග්‍රහණය කර තෙවන ස්ථානයේ ලෝකඩ පදක්කම දිනා ගැනිමට මට හැකියාව ලැබුණා. එත් එක්කම පාසලේ මා ජනප්‍රිය වුණා. කවුරුවත් නොකරන ක්‍රිඩාවක් කිරිම සම්බන්ධව.

මට මගේ මේ ජිවිතය තුල මගේ ජිවිතය නවමු මානයකට හරවන්නට තවත් ගුරුමෑණියක් හමුවුණා. ඇය අපේ ක්‍රීඩා පාරිපාලිකාව වු නීලූ මැඩම් මට ප්‍රශංසා කල අයුරුත් මා අගය කල අයුරුත් මතකයට නැගේ.

"දිනෙත්මි මේක අපි අපේ ස්කෝලෙත් පටන්ගමු ඒකට මං ඔයාට උදව් කරන්නම්"
මැඩම් එහෙම කියලා අපේ ක්‍රීඩාවට විතරක් නොවේයි මවත් මැඩම් ළඟට ගත්තා.

අපේ නිලූ මැඩම් හරිම ලස්සනයි මැඩම්ට තිබුණේ හරි ලස්සන හිනාවක් මැඩම් හරි ලස්සනට අදින කෙනෙක් ඒවගේම තමයි අපේ නිලූ මැඩම් අපි වාගේම මහාමායා ආදි ශිෂ්‍යාවක් මැඩම් හැම වේලාවෙම අපිට හරි දේ කියලා දෙන්න ගොඩාක් මහන්සි වුණා.

මැඩම් එක්ක ගත කරපු ඒ සුන්දර කාලය අදටත් මා සිහි කරන්නේ ඉතාමත් සෙනෙහසින් මාගේ ජයග්‍රහණයට පාසල් වර්ණ ප්‍රදානෝත්සවයේ දි වර්ණ ලබා දිමෙන් අනෙකුත් මහාමායාවියන් අතර මෙම ක්‍රිඩාව පිළිබඳ උනන්දුවක් අවධානයක් ඇතිවන්නට හේතු වුණා. මැඩම් මට ලබාදුන්නේ ලොකු අවස්ථාවක් හරි ආඩම්බරෙන් තමයි මා එදා වර්ණ ප්‍රධානෝතසවයට සම්බන්ධවුණෙත්.

නීලූ මැඩම් මට ගොඩාක් සමීප වුණා
"දිනෙත්මි කවදා හරි ඔයා ශිෂ්‍ය නායිකාවක් වෙන්නම ඕනේ " මැඩම් කිව්වා.

මං මැඩම්ගේ ඒ වචන ටික තරයේම හිතේ තියා ගත්තා.

මැඩම් එක්ක ගත කරන කාලය හා මැඩම්ගේ හමුවිම මාගේ ජිවිතය නව මානයක් කරා ගෙනයන්න සමත්වුණා. මැඩම්ගේ ඒ ආදරණිය වචන වලට ආදරණිය ඔවදන් වලට

වැටුණු හැම වෙලාවේම මාව ආයේ  නැගිටවන්න වෙරදරපු  ඔබේ ආදරණීය දෙඅත්වලට මැඩම්ගේ සුන්දර සිනාවට මං හදවතින්ම ආදරෙයි. මැඩම්.

මේ වසර මං මගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය කියලා හදුන්වන්නේ මේ හේතු නිසාම තමයි. මගේ ජීවිතයට ගොඩාක් ලොකු බලාපොරොත්තු හීන මේ අවුරුද්දේදි  ඇතුල් කරන්න වගේම මගේජීවිතය සාර්ථක කරගන්න නිවැරදි මඟ පෙන්විමක් දෙන මගේ  ආදරණීය ගුරුමෑණිවරු ගුරු පියවරු මෙහිදි හම්බ වුණා.

පාසල් ජිවිතයේ සොඳුරු වසරක් මෙසේ නිමා විය.

## 10 ශ්‍රේණිය

9 පංතියට මං ගොඩාක් ආදරෙයි. ඒ නිසා 9 පංතිය දාලා යන්න මට හිත දුන්නේ නෑ. කොහොමින් කොහොම හරි 10 පන්තියටත් යන්න වුණා.

මේ වසරේ දි මගේ පංතිභාර ගුරුමෑණිය වුනේ ඕෂධි ගුරුමෑණියයි. ඇය මාදුටු තවත් ලස්සන ගුරුමෑණියක් මැඩම් ඔසරිය ඇන්දාට හරිම හැඩයි. මැඩම් අඳින සාරි වලින් ලස්සනම සාරිය තමයි රතුයි කළුයි බතික් ඔසරිය. ඒක ඇන්දාම මැඩම් වෙනදාට වඩා ලස්සනට පෙනවා මැඩම්.

මැඩම්ගේ ආදරණිය වචන ඔවදන් අපේ හිතේ හැමදාම රැදිලා තියෙයි. මැඩම් අපිට ඉගැන්නුවේ ඉතිහාසය විශය මැඩම් හැමදාම උදේට පන්තියේ ඉස්සරහට ගෙන්නලා සිතියම් ලකුණු කරවපු හැටි අදටත් මට මතක් වෙනවා.

මැඩම් කරපු දේවල් නිසා අපිට විෂය හරිම රසවත් වුණා. අපිට ඉංග්‍රීසි විෂය ඉගැන්වුයේ දීපා ගුරුමෑණියයි. මැඩම් ටිකක් සැරයි. හැබැයි හරිම ආදරණියයි. අපි මැඩම් එක්ක වැඩ කලේ හරිම ආසාවෙන්.

මැඩම් පංතියට ඇවිල්ලා ගුඩ් මෝනින් කියුවාට පස්සේ මුලින්ම බලන්නේ ගෙදර වැඩ කලාද කියලා ඊට පස්සේ ගෙදර වැඩ කරපු නැති අයව නැගිට්ටලා තියනවා. අපිට ගොඩාක් දවසට ගෙදර වැඩ නොකර ඇවිල්ලා හිටගෙන ඉන්නවා, සමහර දාට ගුඩ් මෝනින් මැඩම් කියලා හිටගෙනම ඉන්නවා අපි. මැඩම් අහනවා ඇයි හිටගෙන කියලා "අපි ගෙදර වැඩ කලේ නෑ මැඩම්"

මැඩම්ට ඒ වේලාවට ටිකක් කේන්ති යනවා. ටික වේලාවක් අපව නැගිටවලා තියලා ආයෙත් ඉඳගන්න කියනවා.

ගෙදර වැඩ කරලා නැති නිසා ලැබෙන දඩුවම තමයි ඉංග්‍රීසි පාඩම මුළු පන්තියටම ඇහෙන්න කියවන්න වෙන ඒක එදා අපිට දඩුවමක් වුණාට අපිට හොඳට පොත කියවන්න පුළුවන් වුනා කියලා තේරුම් ගියේ අද.

මැඩම්ගේ ආදරණිය වචන වලට ආදරණිය දඩුවම් වලට අපි හරි ආදරෙයි මැඩම්.

මේ වසරේදි තවත් සොදුරු ගුරු පියෙක්ව මට හමු වුණා. ඒ අපේ විද්‍යාව ගුරු පියාණන් වන අපේ සුමිත් සර්.. ඔහු හරිම නිහතමානි පිළිවෙලට ඉන්න කැමැති හැම දෙයක් ගැනම හොඳින් තේරෙන ආදරණිය ගුරු පියෙක් සර් හැමවේලාවෙම අපිට කියලා දුන්නේ පිළිවෙල කියන එක සහ වැඩක් වෙලාවට කිරිම ගැන. සර් ගොඩාක් හිනා වෙන කෙනෙක් නෙවෙයි. සර්ගේ හිනාව මුහුණෙන් පෙන්නේ නැති වුනාට හදවතින් හරි ලස්සනට සර් හිනා වුණා.

අපේ ජයග්‍රහණයක් දැක්කාම ගොඩාක්ම සතුටු වුනේ සර්.අපේ හොඳක් දැක්ක තැන ඒදේ අගය කළා. වගේම නරකක් දුටු තැන ඒක කියලා දෙන්නත් සර් අමතක කලේ නෑ. මාගේ පාසල් පිවිතය නවමු මානයකට ගෙනියන්නට අපේ සුමිත් සර්ට පුළුවන්වුණා.

සර් අපි වෙනුවෙන් කරපු හැමදේම අපි ණයගැති.

මේ සේරම එක්ක අධ්‍යාපන කටයුතු කරගෙන පළමු කඩයිම් විභාගයට මුහුණ දෙන්නට අපි සුදානම් වුණා.

විභාගය එක්ක නොදැනිම වසර ගෙවී ගිය.

## පළමු කඩයිම් විභාගය සමඟ ගෙවුණු අපූරු වසරක්.

පළමු කඩයිම් විභාගය මුහුණ දෙන්නටයි මේ සුදානසම් වෙන්නේ ඕෂධි මැඩම් එක්කම 11 පන්තියට යන්න අපිට පුළුවන්වුණා. ප්‍රශ්ණ පත්‍රවලින් පිරුණු සම්මන්ත්‍රණ වලින් පිරුණු අවුරුද්දක් අපිට ගත කරන්නට ලැබුණත් හරිම සතුටින් තමයි අපි කාලය ගත කලේ.

වෙනදාට වඩා උනන්දුවෙන් වැඩ කරන්න කියලා අපිව ගොඩාක් උනන්දු කරා මැඩම්ලා

"කොහොමහරි හොඳට පාඩම් කරලා හොඳ සාමාර්ථයක් ගන්න ඕනේ" අපේ නිලු මැඩම් හැමදාම කියුවේ එහෙම. මන් උපරිම  උත්සහකරා හොඳ ප්‍රතිඵලයක් ගන්න.

පළවෙනි කඩයිම් විභාගය තිබුණත් අධ්‍යාපන චාරිකාව යන්නට නම් අපි අමතක කරේ නෑ නොදැනිම මේ අවුරුද්දත් හරි අපූරුවට ගෙවිලා ගියා.

## පුහුණු ශිෂ්‍යනායිකාවක් ලෙස භාරධුර වගකීමක්

අ.පො.ස සාමන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු මහාමායාවියන් වශයෙන් අපට එක් වටිනා වරමක් ලැබෙනවා ඒ තමයි අපට ශිෂ්‍ය නායිකා තනතුරට ඉල්ලුම් කර පුහුණු ශිෂ්‍ය නායිකාවක් ලෙස කටයුතු කල හැකි වීමයි. මම ඒ වරම පාසලෙන් ඉල්ලාගත් අයගෙන් එක්කෙනෙක් මේ පාසල් ජීවිතය තුල මා ලබාගත් ලොකුම ජයග්‍රහණය එය විය. පුහුණු ශිෂ්‍ය නායිකාවන්ට ලබාදුන්නේ ප්ලාස්ටික් බැජ්යක් ඒක ප්ලාස්ටික් වුණාට ශිෂ්‍ය නායිකාවන් වුණ හැමෝම ඒ බැජ්එකට හරිම ආදරෙයි. පුහුණු ශිෂ්‍ය නායිකාවක් ලෙස බැදුණු පළමු දවසේ අපිට අපේ හිටපු ප්‍රධාන ශිෂ්‍යනායිකාව වුණු සරනි අක්කි කිව්වේ ඔයාල දැන් ඉන්නේ විදුරු පෙට්ටියක කවුරු කොහොම මොන කෝණයකින් බැලුවත් ඔයාලා කරන හැම දෙයක්ම පැහැදිලිව පෙනවා ඒ නිසා හැම අතින්ම ඔයාලා සර්ව සම්පූර්ණ වෙන්න උත්සහ කරන්න කියලත් තවකෙනෙක්ගේ වැරැද්දක් පෙන්නලා දෙන්න කලින් තමන්ගේ අඩුපාඩු අවම කරගන්න කියලා.

අක්කිගේ ඒ වචන ටික මට තාමත් හොඳට මතකයි. ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ හමුවීමත් පසුව අපට අපේ නිවාස වලට භාර දුන්නා. මගේ නිවාසයේ නිවාස නායිකාව වුනේ රොෂාලි අක්කි. අපේ පළමු හමුවේදිම අක්කි අපිට කිව්වේ අපේ නිවාසය ජයග්‍රාහි මාවතට ගෙනියන්න අක්කිට සහයෝගය දෙන්න කියලා. අපිට අපේම කියලා කියන්න පුළුවන් අක්කිලා හය දෙනෙක් නිවාසයේ හිටියා. අක්කිලා හය දෙනාම ටිකක් සැරයි. ඒත් අක්කිලා අපිට ගොඩාක් ආදරෙයි. කියලා අපි දන්නවා.

පුහුණු ශිෂ්‍යනායිකාවක් විදිහට ගතකරපු මේ කාලයේ මට භාරදීලා තිබුණේ හය ශ්‍රේණිය පංති වල වැඩ කටයුතු ගැන හොයලා බලන්න. මට පුංචි නංගිලාව හසුරුවන්න ඒ තරම් අමාරු වුනේ නෑ මොකද මටත් නංගි කෙනෙක් ඉන්න නිසා එයාලට කතා කරන ඕනේවිදිහ ගැන අවබෝධයක් මට තිබුණ නිසා වෙන්න ඇති කියලා මං හිතනවා.

කවුරුහරි වැඩක් භාරදුන්නොත් ඒක වෙලාවට කරලා ඉවර කරන්න ඕනේ කියලත් ඒ වැඩේ පුළුවන් තරම් පිළිවෙලකට කරලා ඉවරකරන්නත් ඕනේ කියලත් අක්කිලා අපිට කියලා දුන්නා.

එන්න එන්නම පාසලේ වගකීම් අපට පැවරෙද්දි තවතවත් වගකීමෙන් උනන්දුවෙන් අපි වැඩ කලා අපේ පොඩි හරි අඩු පාඩු දැක්ක ගමන් අපේ අක්කිලා අපිට ටිකක් සැරවුණු.

පාසලේ ප්‍රධානතම උත්සවයක් වුණු ක්‍රීඩා උත්සවයේ දින නියම වෙලා කියලා දැනගත්තාම අක්කිලා අපිට වැඩ පැවරුවා නිවාසය දිනවන්න උපරිම මහන්සි ගන්න කියලා අක්කිලා අපිට අවවාද කලා. අපිට මුලින්ම කරන්න තිබුණේ තරඟ වලට ළමයි ඇතුලත් කරගන්න එක.අපි හැමෝම වයස් කණ්ඩායම් බෙදාගෙන ඒවී කණ්ඩායම් වලට ළමයි ඇතුළත් කරලා අයදුම් පත්‍ර සම්පූර්ණ කලා මේ කාලයේ Covid වසංගතය නිසා එතරම් කාලයක් පාසල් පැවැත්වුනේ නෑ. ඒ නිසා ළමයි තෝරා ගැනීමේ දි යම් යම් ගැටලු මතු වුණා. ඒත් අපි 13 දෙනාම එකට එකතු වෙලා අපේ පළවෙනි අභියෝගයට සාර්ථකව මුහුණ දුන්නා.

6 වන ශ්‍රේණියට අලුතින් ආපු නංගිලා ගෙන් අපේ නිවාසයට අයිති නංගිලාව එකතු කර ගත්ත එක අපේ මිළඟ අභියෝගය වුණා. නංගිලාව අපිත් එක්ක තරඟ වලට එකතු කරගත්තා. නිවාසයේ කණ්ඩායම් තරඟ දින පැවැත්වීමට සුදානම් කර තිබුණු ඒ ජයග්‍රාහි දිනය උදා විය. කණ්ඩායම් තරඟ සියල්ලම පාහේ ඉහළින්ම ජයග්‍රහණය කිරීමට යශෝදරා

නිවාසයේ අපට හැකිවිය. එදා අපේ අක්කිලා හිටියේ ගොඩාක් සතුටින් ඒ වගේම තමයි මායා නිවාසය හා අපි අතර තිබුණේ ඉතාම පොඩි ලකුණු පරතරයක් ඔවුන් අපිව පසු කරයි කියලා ලොකු බයක් අපට තිබුණා. ඒ නිසාම අක්කිලා අපිට තව තවත් දිරිමත් කළා. කොහොම හරි දිනන්න ඕනේ කියලා කණ්ඩායම් ක්‍රීඩා ශූරතාවය ලබා ගන්නට අපට හැකියාව ලැබුණත් ඒකල තරඟ ශූරතාවලිය ලබාගන්න අපි කොමොහරි මහන්සි වෙන්න ඕනේ කියලා අක්කිලා අපිට කිව්වා. අක්කිලා ක්‍රීඩා උත්සවත් සමඟම අපිට ගොඩාක් ලංවුණා.

ක්‍රීඩා උත්සවයට අවශ්‍ය සියලුම සැරසිලි අපි අතින්ම නිර්මාණය කරන්න අපිට සිදු වුණා. ඒ හැමදේම අපි 13න් දෙනා එකට එකතු වෙලා තමයි කලේ. අපි එකතුවෙලා මල් මහපු හැටි සැරසිලිහදපු හැටි මතක් වෙනකොට මාව ඒ කාලයට අරන් යනවා.

අපි නොවිසිල්ලෙන් බලා සිටි දවස ක්‍රීඩා උත්සවය දිනය උදා වුණා. කෙසේහෝ ජයගන්නවා යන අරමුණින් අපි සියලු දෙනා එදා ක්‍රීඩා පිටියට ගියා.එදින පැවති තරඟ වලින් බොහෝ තරඟ ජයගැනිමට අපට හැකියාව ලැබුණා. අපේ ප්‍රාර්ථනාව වුනේ කොහොමහරි දිනන එක. අපේ අක්කලාත් බලන් හිටියේ අවසන් තිරණය දෙනකන් එය මෙසේ විය.

“2022 වර්ෂයේ මහාමායා බාලිකා විද්‍යාලයේ ක්‍රිඩා උත්සවයේ සමස්ථ ශූරතාවය දිනා ගනු ලබන්නේ යශෝදරා නිවාසයයි. උණුසුම් සුභ පැතුම් ඔබට..”

අපේ අක්කිලා 6 දෙනාගේ ඇස් වලින් කඳුලු වැටෙනවා අපි කලින් දැකලා තිබුණේ නෑ අපේ අක්කිලා 6 දෙනාගේම තිබුණේ සතුටු කඳුළු අක්කිලාට වගේම අපි 13 දෙනාටත් එදා කියාගන්න බැරි සතුටක් තිබුණේ.

එදා ඒ විදිහට ජයගත්තේ අවුරුදු 20ක් පුරාවට සිව්වන ස්ථානයේ හිටපු යශෝදාරා නිවාසයයි.අපේ නිවාස නායිකාව වු රොෂාලි අක්කිට කුසලානය ගෙදර අරන් යන්න පුළුවන් වුණා. ඒක අපි 13න් දෙනා ලබපු ලොකු ජයග්‍රහණයක්. සතුටු කදුලැලි මධ්‍යයේ ඒ සුන්දර දිනයත් ගෙවිලා ගියා.

ක්‍රීඩා උත්සවයෙන් පසුව තිබුණු විවාද තරඟාවලිය, සංගීත තරඟාවලිය, නර්ථන තරඟාවලි යනාදි සියල්ලම ජය ගැනිමට අපි සමත් වුණා. ඒ හැමදේටම හේතුව තමයි අපෙ අක්කිලා 6දෙනා.

අක්කිලා 6 දෙනාම අපිව ජයග්‍රාහි මාවතකට යොමු කලා. හැම වේලාවකම නිවැරදි තීරණ ලබා දුන්නා. අක්කිලාට අපි හැමදාමත් ආදරෙයි.

අපිට ඊළඟට සංවිධානය කරන්නට ලැබුණේ අක්කිලාගේ අවුරුදු උත්සවය ඒකත් අපි හරිම ආසාවෙන් භාරගත්තා. අපිට ඊළඟට වැඩ කරන් ලැබුණේ නිවාස මට්ටමින් නෙවෙයි. අපේ සරනි අක්කාට ඕනේ වුණේ අපි හැමෝම නිවස භේදයකින් තොරව එකම ශිෂ්‍ය නායිකා මණ්ඩලයක් විදිහට වැඩ කරනවා බලන්න ඒ නිසා අක්කි අපිව කණ්ඩායම් 4 කට බෙදුවා නිවාස වල අපට මිශ්‍ර කරලා දාලා අපේ අක්කිලාවත් මිශ්‍ර කරලා තමයි කණ්ඩායම් වලට දැම්මේ. ඒහෙම කරපු එකත් ගොඩාක් ලොකු අපූරු අත්දැකිමක් එකතු කළා. නිවාසයේ අපි 13න් දෙනානේ මෙච්චර කල් වැඩ කලේ දැන් ටිකක් නුහුරු වුනාත් අනෙක් නිවාස වල අයත් එක්ක වැඩ කරන්න ලැබුණු එක ගොඩාක් හොඳයි කියලා අද මට හිතෙනවා. ඉතිං අවුරුදු උත්සවයට අවශ්‍ය සියලුම සැරසිලි එකට එකතු වෙලා සුදානම් කරලා අවුරුදු උත්සවයට ලෑස්ති වුණා.

අපේ අක්කිලා හැමෝම එදා හරිම හැඩට හිටියා අක්කිලා හැමෝම ලස්සන ලස්සන පාට පාට ඔසරි ඇදලා හිටියා. හැමෝම හරි උඩරට මැණිකේලා වගේ ලස්සනට හිටියා. අවුරුදු සෙල්ලම් වලින් අවුරුදු චාරිත්‍ර වලින් වගේම ලස්සන නර්ථන වලින් උත්සවය තවත් ලස්සන වුණා. ඒ වගේම තමයි එදා අපි බලන් හිටපු තවත් එක් අවස්ථාවක් උදා වුණා. ඒ තමයි අපිට අපේ අක්කිලා එක්ක කඹ ඇදිමේ තරඟවලියට යන්න අවස්ථාව ලැබුණා අපේ

අක්කිලා එකපිලක් ලෙසත් අපි 44 තවත් පිලක් විදිහටත් තරඟ කලා. ඇත්තෙන්ම කිව්වොත් එදා අපේ කඹේ කැඩුනා අපේ ශක්තියට. කොහොමහරි තරඟය දින්නේ අපේ අක්කිලා ටික තමයි.

අවුරුදු අසිරිය එක්ක එදා දවස ගෙවී ගියා හරි අපූරුවට.

එකල පැවැති Covid 19 වසංගතය හේතුවෙන් විද්‍යාලය තුල එන්නත්කරණ වැඩසටහනක් සංවිධානය කරන්නට අපට ලැබුණු තවත් අපූරු අවස්ථාවක් පාසලේ මෙවන් එන්නත්කරණ වැඩසටහනක් සංවිධානය කර තිබුණු ප්‍රථම අවස්ථාව මෙයයි. එයද සාර්ථකව නිමා කිරීමට අපට හැකිවිය.

Covid 19 වසංගතය හේතුවෙන් පාසල් පද්ධතිය මාස 2ක් කාලයක් වසා තබන්නට රජය තිරණය කල අවස්ථානුකූල පාසල් අධ්‍යපන කටයුතු සම්පූර්ණයෙන් අඩාල තත්වක තිබුණු හෙයින් අපේ ජේෂ්ඨ ශිෂ්‍ය නායිකාවන් මාධ්‍යගත ක්‍රමයට ඉගැන්වීමට ක්‍රම වේදයක් සකසා තිබුණි. විදුහල්පතිතුමියගේ අනුදැනුම හා මාර්ගෝපදේශනය සහිතව මෙය සිදු කිරීමට ඔවුන් කටයුතු කර තිබුණා. අක්කිලා අපව මාධ්‍යගත ඉගැන්වීමේ ක්‍රියාවලියට යොමු කලා. අපට හැකි පමණින් විවිධ විෂයන් මාර්ගගත ක්‍රමයට ඉගැන්වීමට අපි සහය වුවා. අපේ මේ සත් ක්‍රියාව ගැන සියලු දෙනා අපට ප්‍රශංසා කලා ඒ ප්‍රශංසා සියල්ලටම පාහේ හේතු වුයේ ජේෂ්ඨ ශිෂ්‍යනායිකා වන්ගේ නිවැරදි තීරණ ගැනිමයි. එයද අති සාර්ථක අන්දමින් නිමා කිරීමට අපට හැකි වුණා.

මෙවැනි වැඩසටහන් ගණනාවක්ම සංවිධානය කරමින් එහි වගකීම් දරන්නට අපට සිදු වුණා. ජේෂ්ඨ ශිෂ්‍යනායිකාවන්ගේ මඟපෙන්වීම යටතේ මේ සියල්ල ඉටු කිරීමට අපට සිදුවුණා. පාසලේ සංවත්සර උත්සවය නිමිති කරගෙන පාසලේ පැවැත්වූ පහන් පූජාවක් ද සිදුකල අතර එය නොමැකෙන මතක සටහනක්.

Covid 19 වසංගතය නිසා පුහුණු ශිෂ්‍යනායිකා තනතුරට ඉල්ලුම්කල දිනයේ සිට වසරක් පමණ කාලයක් කටයුතු කිරීමට සිදුවීම සුවිශේෂී අවස්ථාවකි. ඒ කාලය පුරාවට අපිටත් අපේ අක්කිලාටත් එක්ක කාලය ගතකරන්න පුළුවන් වුණා.

මේ පුහුණු ශිෂ්‍යනායිකා ධුරකාලයනිමා කරන්නට සියලු කටයුතු සුදානම් කර තිබුණා. අපට සම්මුඛ සාකච්චාවකට යොමු කළ පසු එම තිරණ ගෙන තිබුණා. පාසලේ සියලුම වැඩසටහන් වල භාරධුර වගකිමක් ගෙන කටයුතු කරමින් ගෙවුණු මේ අපූරු කාලය නොමැකෙන මතක පිරි කාලයක් වුවා.

## මං දැන් මහාමායාවේ කණිෂ්ඨ ශිෂ්‍යනායිකාවක්

පුහුණු ශිෂ්‍ය නායිකා තනතුර දරා වසරක පමණ කාලයකට පසු පැවති සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වී පාසලේ කණිෂ්ඨ ශිෂ්‍යනායිකාවක් ලෙස තේරිපත් වුන දින අදටත් සිහි කරන්නේ ඉතාමත් සෙනෙහසිනි.

පුහුණු ශිෂ්‍යනායාකාවක් ලෙස පැලැදි ප්ලාස්ටික් බැජ්ය වෙනුවට රිදී පැහැති යකඩ බැජයක් පලදින්නට අපට අවස්ථාව ලැබුණා. එත් අපි හැමෝම ඒ ප්ලාස්ටික් බැජ් එකට හරිම ආදරෙයි කවුරුත් ඒක ගලවන්න කැමති වුනේ නෑ. ගවුමේ කරට ටිකක් පහළින් කෙලින් අතට ගැහුව බැජ් එක වෙනුවට රදී පාට යතඩ බැජ්යක් තිරස් අතට ගහන්න වෙලා. සිරස් අතට ගහපු පුහුණු ශිෂ්‍යනායිකා ලාංජනයේ සිදුරු තාමත් නිල ඇදුම් වල තියනවා. ඒත් ඒ වෙනුවට තිරස් අතට රිදී බැජ්යක් පලදින්නට අපට සිදුවුණා. අපි මේ පුහුණු ශිෂ්‍ය නායිකා බැජ්යට කොයිතරම් ආදරෙයිද කිව්වොත් අපි අදටත් ඉස්කෝලේ යන කොට සාක්කුවේ මේ බැජ් එක දාගෙන තමයි යන්නේ.. මුලදි අක්කිලා අපිට කතා කලේ Trainee කියලා දැන් අක්කිලා Trainee කියලා අපිට කතා කරනවා. ඒත් අපි කැමති Assistions කියලා අපිට කතා කරනවාට අක්කිලා ඉස්සර තරම් අපිට සැර වෙන්නේ නෑ. දැන් අපිට ටිකක් වැඩිපුර වගකීම් අක්කිලා පැවරුවා.

අක්කිලා අපිත් එක්ක තවත් සමීප වෙලා දෝ කියලා හිතුනා.

අපිට අලුතින් හම්බවුණ බැජ් එක අපේ අක්කිලාම අපිට පැළැන්දුවා ඒක හරිම ආදරණිය මතකයක් වුණා. අපිට අක්කිලා හැම වේලෙම අපි ගැන හොයලා බැලුවා අපේම අක්කිලා වගේ අපි ලඟින්ම හිටියා. සුභ පැතුම් මධ්‍යයේ තවත් වගකීම් ගොඩක් පැවරුණා අපිව අලුත් මේ බැජ් එක හම්බවුනත් මේක ගහන් ඉන්න වුනේ හරිම ටික කාලයයි. අපේ අක්කිලාට A/L නිසා අපිට ජේෂ්ඨ ශිෂ්‍යනායිකා තනතුරු දෙන්න තිරණය කරලා තිබුණා.

අක්කිලා වෙනදාට වඩා අපිට ගොඩාක් සමීප වුණා. වෙනදා හොයලා බලනවාට වඩා අපි ගැන හොයලා බැලුවා.

වැඩක් දිලා ඒකවෙලාවට කලේ නැත්නම් අක්කිලා අපිට සැරවුණ හැටි අපිට ප්‍රශ්ණයක් ආපු හැම වෙලාවේම අපේ ළඟින් හිටපු හැටි හැමදාම අපේ හිත්වල රැදිලා තියනවා.

වගකීම් ගොන්නක් සහිතව කණිෂ්ඨ ශිෂ්‍ය නායිකා ධුරකාලය සිමා විය.

## මහාමායා මව් තුරුලේ ගෙවන අවසන් වසර දිත්වය

අ.පො.ස සමාන්‍ය පෙළ විභාගයෙන් පසු මා අ.පො.ස උසස් පෙළ සඳහා කලා අංශයෙන් විභාගයට මුහුණ දිමට තිරණය කලෙමි. මා 12 - බී කලා පංතියට ඇතුලත් වු පළමු දින මාගේ මතකයට නැගේ

එකල මාගේ පංතිභාර ගුරුමෑණිය වුයේ මේකලා ගුරු මෑණියයි. ඇය ඉතාමත් චාම් කෙනෙකි. ඒවගේම ආදරණිය ගුරු මවක් ඇය විශ්‍රාම දිවියට පා තබන්නෙ ද අප 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන විටදිය. ඇය දුන් උපදෙස් ඇයගේ සුන්දර සිනාව නොමැති අඩුව කලා අංශයේ අපට පමණක් නොව පාසලේ සියලුම දෙනාට අදටත් දැනෙනවා.

මේකලා ගුරුමෑණියගේ විශ්‍රාම දිවියේ ආරම්භයත් සමඟ අප පංතිභාර ගුරුමෑණිය ලෙස කටයුතු භාර ගත්තේ දිනුෂානි මැණිකේ ගුරුමෑණියයි. ඇත්ත වශයෙන් ම කිවහොත් මා දුටු ලස්සනම ගුරුමෑණිය ඇයයි. ඇයගේ සිනහවෙන් පිරි සුන්දර මුහුණ උදෑසනම දක්න්නට ලැබීම අප දවසම සුන්දර කරනු ඇත.

පාසලේ ක්‍රීඩා නායිකාවක් වශයෙන් කටයුතු කල මේ අවධියේ දි පාසලේ අධ්‍යාපන කටයුතු විශාල ප්‍රමාණයක් මා හට මගහැරුණි. එවිට මාගේ පංතිභාර ගුරුමෑණිය ඒවා මට නිසි අයුරින් සංවිධානය කරදි පහසු සෑම වෙලාවටම මගහැරි ගිය පාඩම් නැවත නැවතත් කියාදුන්නාය. සියලුම වාර විභාගයන් වලට මුහුණ දෙන ලෙස ඈ මට තරයේ අවවාද කළ අයුරුත් මාගේ සිහියට නැගේ. කලා අංශය මඟින් වාර්ෂිකව සංවිධානය කරන ලද කලා දිනයද සංවිධානය කිරිමට අපට මෙහිදි අවස්ථාව හිමිවිය. කලා සංගමයේ සභාපති වුයේ පංචලි සහෝදරියයි. එමෙන්ම ලේකම් තුමිය වුයේ සංජනා සොයුරියයි,භාණ්ඩාගාරික තුමිය වුයේ උත්පලා සොහොයුරියයි. මෙම තිදෙනාම මාගේ හොඳම යෙහෙලියන් වු බැවින් කලා දිනයේ කටයුතු වලට වැඩි සහයක් දිමට මට අවස්ථාව ලැබුණි. සුපුරුදු ලෙසම කලා දිනයේ නිවේදන කටයුතු කිරිමට අවස්ථාව ලැබිණි. එය මා භාරගත්තේ ඉතාම කැමැත්තෙමි.

කලා අංශයේ අපි ඇඟිලි ගනිමින් සිටි ඒ අපුරු දවස උදා විය. කලා අංශය මඟින් සංවිධානය කල කලා දිනය ප්‍රවීණ රංගධර ධර්මප්‍රිය ඩයස් මැතිදුන් සහ ආදි මහාමායාවියක් වු සොනාලි කොඩිතුවක්කු මැතිණියගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් විද්‍යාලිය ශ්‍රවණාගාරය තුල පැවැත්විණි.

කලා දිනයෙන් පසු බොහෝ මිතුරියන් නැවත හමුවුයේ පාසලේ පැවැත් වු විභාග වලදි පමණි.

පාසලේ ශිෂ්‍ය නායිකාවක්වු බැවින් සෑම දිනකම පාහේ පාසල් යාමට අපට සිදුවිය.

වාර්ෂික අධ්‍යාපන චාරිකාව යෑමට අපට අවස්ථාව ලැබුණි. එම අධ්‍යාපන චාරිකාව මාගේ මතකය අළුත් කරන තවත් සුන්දර දිනයකි. අළුයම 4ට පාසලට එන ලෙස පංතිභාර ගුමෑණිය අපට චාරිකාවට පෙරදින පැවසු අතර චාරිකාවට පෙර දින අපට අවශ්‍ය පණිවිඩ අප හැසිරිය යුතු ආකාරය පිළිබඳව අපව දැනුවත් කල ආකාරයත් මතකයට නැගේ. චාරිකාව යෑමට පෙර දින මා අවශ්‍ය බඩු භාණ්ඩ බෑගයට දමා නින්දට ගිය නමුදු නින්දක් නම් පෙනෙන මානයෙවත් නැත. ඇත්තෙන්ම කිව්වොත් මට නින්ද ගියොත් මාව දාලා මගේ යාළුවෝ චාරිකාවයයි ද කියා මට හිතුනා. චාරිකාව යාමට සියලු දෙනා පැමිණ සිටි අතර සියලු දෙනා එක්ව ගීත ගායනා කරමින් ,ඡායා රූප ගනිමින් කෑම බීම බෙදා ගනිමින් විනෝද වු අයුරු මා මතකයට නැගේ.

ආ.පො.ස. උසස් පොළ විභාගයට මුහුණු දීමට ඇත්තේ තවත් වසරක පමණ කාලයක් බවද ගුරුතුමිය නිතර අපට පසක් කර දුන්නාය.

විවේක කාලයේ දි පංතියේ මිතුරියන් සමඟ සිංදු කිම සියල්ලන්ගේම විනෝදාංශයයි. අපේ පංතියට එහා පැත්තේ තිබුණේ භූගෝල විද්‍යා කාමරයයි. අපි ඒ විදිහට සිංදු කියනකොට තමරා මැඩම් හරි අනුශා මැඩම් හරි පංතියට ඇවිල්ලා කියනවා

"ශිෂ්‍යනායිකාවෝ කී දෙනෙක් මේ පංතියේ ඉන්නවාද ඇයි මෙච්චර කෑ ගන්නේ කියලා"

12 වන වසරේ පැවති දෙමාපිය හමුව මාගේ උ.පෙළ අධ්‍යාපන ගමනේ තවත් සුවිශේෂ හැරවුම් ලක්‍ෂයක් විය. එනම්, ආර්ථක විද්‍යා ගුරුවරයා සහ මව හමුවීමයි. එහිදි අනුර සර් කිව්වේ එක්කෙ බැජ්එක එහෙමත් නැත්නම් විෂය යනුවෙනි. එහිදි මගේ තිරණය වුයේ විෂය මාරු කිරිමයි.

ආර්ථික විද්‍යා පන්තියේ අන්තිම දවස මගේ හදවතේ රැදුනු තවත් අරුම පුදුම දිනයකි. ඊට හේතුව මාගේ ගුරුවරයාගේ අවසන් ඔවදන "ඔයා ඔය ගහන් ඉන්න බැජ් ඔක්කෝම දිලිසෙන්නේ අධ්‍යාපනය හා විෂය බාහිර කටයුතු සමබරව කර ගත්තොත් විතරයි. අද ආර්ථික විද්‍යාව අත හැරලා ගියාට කමක් නෑ හිතේ තියාගන්න මගේ පුතේ ඉස්කෝලෙට එන්න ඕනේ පාසලේ තියෙන උත්සවයකට ප්‍රධාන ආරාධිත අමුත්තිය වෙලා"

මගේ හිත ටිකක් නොසන්සුන් වෙලා කඳුලුත් ගලන්න පටන් ගත්තා. සර් දිහාවත් නොබලා පන්තියෙන් එළියට ආවා. සර්ගේ කථාව තදින්ම හිතේ දරාගෙන.

12 වසරේ තවත් අපුරු එක් දවසක් මට පුංචි තෑග්ගක් හම්බ වෙනවා ඒකමට ගෙනත් දෙන්නේ මගේ දේශපාලන විද්‍යාව උගන්වන චාන්දනි ගුරුමෑණියන් එදා ඒක මට දිලා මැඩම් මට කියනවා ඉස්කෝලේ පුරා දුවන ඔයා කකුල් දෙකට මේක දාගන්න ඔයා දින්න දවසක කියලා. ආදරෙයි ගොඩාක් ඒ වචන වලට මං අදටත්.

තමරා මැඩම් කියන්නේ ආදරේ උල්පතක් ඇය මා අමතන්නේ මැණිකේ කියලා මං ආසයි ඒ වචනෙට මැඩම් විතරයි මට එහෙම කියන්නේ හැබැයි මට මැඩම්ගේ පන්තිය ගොඩාක් මඟහැරුණා.

ක්‍රීඩා උත්සවය ,වර්ණ ප්‍රධාන උතත්සවය ත්‍යාග ප්‍රධාන උත්සවය, සාහිත්‍ය දින ආදි විවිධ උත්සව ක්‍රියාකාරකම් සමඟ 12 වෙනි වසර නොදැනිම ගෙවි ගියා.

නොදැනිම වුනත් 13 වසරටත් අපි ඇවිල්ලා යාළුවෝ ඉස්කෝලේ එන්නේම නැති තරම්. වාර විභායකටවත් එන්නේ නැති අයත් ඉන්නවා. අනේ එයාලා කොහොම ගෙදරට වෙලා ඉන්නවා කියලත් හිතෙවා මම නම් සෙනසුරාදා ඉරිදා දවස් 2කගත කරගන්නෙත් හරිම අමාරුවෙන්

"ඉස්කෝලේ එන්මයි හිත කියලා " අම්මා කියනවා ගොඩාක් වේලාවට මට ඇහිලා තියෙනවා. ගෙදර ඉන්නවාට වඩා ඉස්කෝලේ ගිහින් යාළුවොත් එක්ක ඒ ගත කරන කාලය මොනතරම් සුන්දර ද ඒකමට වචනවලින් කියන්න බැරිතරම් ලොකු සතුටක්.

ඉස්කෝලේ ගිහින් පොඩ්ඩක් කෑහලා බැනුම් අහලා මේසෙට ගහලා සිංදුවක් කියන්න ගෙදර වැඩ කරන් යන්නේ නැතුව පංතියෙන් එලියේ දණ ගහන් ඉන්න පංතියේ ඉස්සරහ හිටන් ඉන්න ආයේ දවසක් එන්නේ නෑ නේ... ඉස්කෝලේ කාලේ විතරයි මේ හැම දේම.

විශේෂයෙන්ම ගැහැණු ළමයෙකුට පාසල් කාලය තමයි ගෙවන්න තියෙන නිදහස්ම කාලය කියලා අම්මා මට නිතරම කියනවා. ඒක ඇත්ත කියලා දැන් මට තේරෙනවා. මේ ගෙවන පැය 5 හරිම නිදහස් ඒ වගේම හරිම සුන්දරයි.

මෙච්චර ඉක්මනට අවුරුදු 13ක් ගෙවුනා ද කියලත් හිතෙනවා මට.

විභාගය ලඟ ලඟට එන නිසා මේ අවුරුද්දේ අධ්‍යාපන චාරිකාව නම් යන්න බැරි වුණා. විභාගය ඉවර වෙනකම් තමයි අපි බලන් ඉන්නේ අපේ ලස්සන මැණිකේ මැඩම් එක්ක චාරිකාව යන්න.

මැඩම් එක්ක ගෙවන අන්තිම දවස් ටික තමයි මේ අපි නැති වුණාට මැඩම්ට අලුත් නංගිලා එයි ඒත් මැඩම් එයාලාට අපිට වඩා ආදරේ වෙන්න එපා මං මැඩම්ට එහෙම කියන්න තමයි හිතන් ඉන්නේ. නැත්තන් මැඩම් අපිට වඩා එයාලට ආදරේ වෙයි. මැඩම්ව දාලායන්න නම් හිත හදාගන්න බෑ අපිට මැඩම්ව වගේම මුළු ඉස්කොලේම දාලා යන්න වෙනවා අපිට තව ටික දවසයි තියෙන්නේ.

නිල් බකල් එක දාලා කොටුකර තියනක ඒ සුදු ගවුම ඇඳලා කොණ්ඩේට තෙල් ගාලා පීරලා ඉස්කෝලේ එන්න තියෙන්නේ තව ටික දවසයි.

## වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීමේ සංගමයේ පළමු කණ්ඩායම් නායිකාව.

වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීම ක්‍රීඩාවට මං සම්බන්ධ වුනේ 2015 වර්ෂයේ සිටයි. 2016- 2017 වර්ෂ වලදී මට ජාතික මට්ටමේ වර්ණ ලබාගන්නට හැකියාව ලැබුණා. නිපුණ වෙඩික්කාරියක් වන්නත් මට හැකියාව ලැබුණා.

2018 වර්ෂයේ දි මට විශේෂ අවස්ථාවක් ලැබුණා ඒ තමයි පෝලන්තයේදී පැවැති වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීමේ තරඟාවලියකට සහභාගි වෙන්න ලැබුණා. මධ්‍යම පළාතෙන්ම තේරී පත්වුණ එකම කෙනා මම විමත් තේරීපත්වුණු සියලුම දෙනාගෙන් ලාබාලතම ක්‍රීඩිකාව මම විමත් විශාල භාග්‍යක් වුණා. ඒවගේම තරඟයෙන් තෙවන ස්ථානයේ ලෝකඩ පදක්කම දිනාගැනිමටද මට වාසනාව ලැබුණා.

මේ ජයග්‍රහණය ලැබුණ බව දැනගත් පසු එවකට පාසලේ ක්‍රීඩා පරිපාලිකාතුමිය වශයෙන් කටයුතු කල අපේ ආදරණීය නිලූ මැඩම් මා අගය කලා. ඒ වගේම ඇය මට පාසලේ වර්ණ ලබාදිමට කටයුතු සුදානම් කර දුන්නාය. මැඩම් කිව්වා අපි මේ ක්‍රීඩාව ඉස්කෝලේ පටන් ගමු කියලා. මගේ හිතෙත් තිබුණ ලොකුම බලාපොරොත්තුව ඒක වුණ බව මම මැඩම්ට කිව්වා. එදා ඉඳලා මැඩම් මට ලොකු ශක්තියක් වුණා. අපේ ක්‍රීඩාවේ ක්‍රීඩාභාර ආචාරිනියත් විද්‍යාලිය ගරු විදුහල්පතිතුමිය මේ ක්‍රීඩාව පාසලේ ස්ථාපිත කරන්නට මට අවස්ථාව දුන්නා.

පාසලේ වායු රයිෆල් හා පිස්තෝල වෙඩි තැබීමේ ක්‍රීඩිකාවන්ගෙන් යුත් කණ්ඩායමක් සැදිමටත් ඔවුන්ව පුහුණු කිරීම් සිදු කරමින් පළාත් හා ජාතික මට්ටමේ තරඟාවලි වලට පාසල නියෝජනය කරමින් සහභාගි කරන්නටත් මා කටයුතු කලා. ඒ හැමදේටම ඒ විදිහට කරන්න පුලුවන් වුනේ අපේ ආදරණිය නිලූ මැඩම් නිසා මැඩම් නොහිටින්න අපිට මේක හිනයක් වෙන්න තිබුණා.

මැඩම් අපේ පාසලෙන් විශ්‍රාම ගත්තාට පස්සේ අපේ ක්‍රීඩාව භාරගත්තේ වත්මන් ක්‍රීඩා පරිපාලිකාතුමිය වන ජිවන්ති ගුරුමෑණිය මැඩම් මේක කැඩෙන්න දුන්නේ නෑ. අපිට අවශ්‍ය සියලුම පහසුකම් මැඩම් අපිට දුන්නා. නොබෝ දිනකින් ජාතිකමට්ටමේ ජයග්‍රහණ ද පාසලට වාර්තා වුණා. ඒ වගේම තවත් කණිෂ්ඨ කණ්ඩායමක් නිර්මාණය කරන්නටත් ඔවුන් පුහුණු කරන්නටත් අවස්ථාව ලැබුණා. ඔවුන්ද පළාත් මට්ටමින් තරගාවලි සඳහා සහභාගි කරවූ අතර විශිෂ්ඨ අයුරින් ජයග්‍රහණ වාර්තා කරන්නට සමත්වුණා.

අද වෙනකොට ජේෂ්ඨ හා කණිෂ්ඨ යනුවෙන් වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීමේ සංගමයේ කණ්ඩායම් ද්විත්වයක් සිටින අතර ඔවුන් පලාත් හා ජාතික මට්ටමින් ශූරයන් විමත් ජාතික මට්ටමින් වර්ණ ලාභින් විමත් සතුටට කාරණයක් වුණා.

මේ සියලු ජයග්‍රහණ හේතු කරගෙන මෙම ක්‍රීඩාව පාසලේ ස්ථාපිත කිරීමට අප විද්‍යාලිය ගරු විදුහල්පතිතුමිය කටයුතු කලා එතුමිය අපට පුහුණුකාරිණියක් ද ලබා දුන්නා. ඒවගේම මා විද්‍යාලිය වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීමේ සංගමයේ පළමු කණ්ඩායම් නායිකාව බවට පත් කළා. පසුව පාසලේ වර්ණ ප්‍රධාන උත්සව වලදී අප ක්‍රීඩිකාවන්ට වර්ණ පිරිනැමීමට ක්‍රීඩා භාර ආචාරණිය ජිවන්ති මැඩම් කටයුතු කලා.

අපි පාසලේ මෙම සංගමය පිහිටුවන්නටත් අපට නව පුහුණුකාරිණියක් ලබා දෙන්නත් ඒසේම අපේ ක්‍රීඩාව භාර ගන්නට මුණසිංහ සර් ඉදිරිපත් විමත් එතුමන්ව ක්‍රීඩාභාර ආචාර්ය වරයා ලෙස පත්කිරිමත් සමඟ මහාමායාවේ ක්‍රීඩා ගොන්නට වායු රයිෆල හා පිස්තෝල වෙඩි තැබීම යන්නත් එකතු වුණා.

එපමණක් නොව එම සංගමයේ පළමු කණ්ඩායම් නායිකාව වන්නටද මට භාග්‍ය ලැබුණා.ඒ සම්බන්ධයෙන් නිහතමානි වු ආඩම්බරයක් ඇති වු බවට කිව යුතුමයි.

අපේ නිලූ මැඩම් නොහිටින්න මට මේක හීනයක් විතරක් වෙන්න තිබුණා. මැඩම් නිසා තමයි මේ හැමදේම අපේ මහාමායාවියන්ට ලැබුනේ.

## පාසලේ ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයේ ශිෂ්‍යනායිකාවක්

එදා අපි නිවාස සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වෙමින් සිටියදී අප විදුහල්පතිතුමිය නිවේදනයක් ලබා දුන්නාය. ඒ 2022 වසරේ ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයට තෝරාගත් නවක ශිෂ්‍යනායිකාවියන් ගැනයි.

2022 වසරේ ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයට තේරුපත් වුණු ශිෂ්‍යවන්ගේ නාමලේඛණය ඉදිරිපත් කිරිමටයි. මේ සුදානම.

2022 වසරේ ප්‍රධාන ශිෂ්‍යනායිකාව ලෙස තේරිපත් වි තිබෙන්නේ තෙනායා මුණසිංහ උප ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ප්‍රිමාලි හෙල්ලරාච ක්‍රිඩා නායිකාව කිමුතු ද සිල්වා උප ප්‍රධාන නායිකාව චිතේරා සමරකෝන් සහය ක්‍රීඩා නායිකාවෝ දිනෙත්මි විරසුරිය, විශ්මි කරුණාරත්න උණුසුම් සුභ පැතුම් සියලු දෙනාටම.

ප්‍රධාන ශීෂ්‍යනායිකාව බවට පත් වු තෙනායා හා ක්‍රීඩානායිකාව වු කිමුතු අපේ නිවාසයේ වු බැවින් අප නිවාසයේ සියලු දෙනා ප්‍රිතිඝෝෂා කරමින් සතුටින් කෑ ගැසුවා. ඒ අවස්ථාවේදි මාගේ මිතුරිය සංජනා මාවෙත පැමිණ මා වැළඳගෙන මට සුභපැතුම් එක්කලා.

“සුභපැතුම් දිනෙත්මි”

“බලන්නකෝ සංපි අපේ දෙන්නෙක්ම තේරිලා ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලයට”.

“දෙන්නෙක් නෙවෙයි තුන්දෙනෙක්”ඇය කිවාය.

“තුන්දෙනෙක් ”

“ඔව් ඔයා සහය ක්‍රීඩා නායිකාව ඔයාට ඇහුණේ නැද්ද දෙයියනේ ”

“ඔය ඇත්තමද ”

ඇය තමයි මට මුලින්ම සුභපැතුම් එකකලේ කරල තෙනායා හා කිමුතු වෙනුවෙන් ප්‍රිතිඝෝෂා කරමින් සිටිය නිසා මට මගේ නම නිවේදය කරන අවස්ථාව මඟහැරුණා.

මා මේ පුවත දැනගත් සැණින් ගියේ මගේ පංතියට මං පන්තියට යනකොට කලා අංශයේ සහෝදරියෝ ප්‍රීති ඝෝෂා එක්කරමින් මා පිළිගත්තා. මගේ පංතිභාර ගුරුතුමිය ද සුභ පැතුම් එක්කලා. මගේ පංතියේ මිතුරියන් මාව හරසරින් පංතියට පිළිගත් අයුරුද අමතක කල නොහැකි සිදුවිමකි.

පාසල් කාලය තුල මා වැඩියෙන්ම සතුටු වු දිනය මෙය කිවහොත් මා නිවැරදි.

අපේ මේ තනතුරු නිවේදනය කල පසු අප ජේෂ්ඨ සහෝදරියන් ද අපට සුභ පැතුම් එක්කලා නිවාසයෙන් වෙන්වි අප තිදෙනා සමඟ තවත් තෙදෙනෙක් එක්විය. 6 දෙනෙකුගෙන් සමන්විත අප තවත් ලස්සන පවුලක් විය. නෙතායා ,ප්‍රිමාලි ,කිමුතු,චිතේරා විශ්මි මේ තමයි මගේ අලුත් පවුලේ සමාජිකාවෝ තෙනාය ගැන කියනවා නම් ඇය තමයි අපේ ශිෂ්‍යනායිකා මණ්ඩලයේ හිටපු ලස්සනම කෙනා. ඒමෙන් ඇය ඉතාමත් කරුණාවන්ත ආදරණිය චරිතයක් ,ප්‍රිමාලි කියන්නේ ඇවිදින පුස්තකාලයක් එයා දන්නේ නැති දෙයක් නෑ එයා හරිම බුද්ධිමත් ඒ වගේම හරිම හුරතල් පෙනුමක් තමයි එයාට තිබුණේ. කිමුතු කියන්නේ අති දක්ෂ පිහිණුම් ශූරියක් එයා තමයි අපේ දියකිදුරිය වතුර කොහෙද අපේ කිමුතු එතන චිතේරා කියන්නෙත් දක්ෂ දැල්පන්දු හා පැසි පන්දු ක්‍රිඩිකාවක් ඒ තමයි අපේ චූටි මැණික විශ්මි කියන්නේ දක්ෂ පැසිපන්දු ක්‍රිඩිකාවක් චිතේරා විශ්මි තරඟයකට ගියොත් දිනලම තමයි එන්නේ මේ තමයි මගේ අලුත් පවුල.

කොහොම කොහොම හරි අපේ නිල ලාංජන පැපදිවිමේ උත්සවය තිබුණා. අපේ අක්කිලා අපට සියලු වගකිම් පවරා දිලා සුභ පැතුම් එක් කරමින් යන්න ගියා. අක්කිලා

අපෙන් වෙන් වුනත් මතකයන් ගොන්නක් අපට දිලා තමයි ගියේ. ඒ මතක හැමදාමත් අපිට පිවත් කරයි.
අපිට ලැබුණු පළවෙනි උත්සවය වුයේ ගුරු දිනය සංවිධානය කිරීමයි. ශිෂ්‍යනායිකා මණ්ඩලයෙන් සාමාජිකයන් සමස්ථ උත්සවයේ අංග ඉදිරිපත් කිරීමට සුදනාම් විය. ඒ සඳහා සියලු දෙනා එකතු වි පුහුණුවීම් ද සිදු කලේ ඉතාමත් සතුටිනි.

ගුරු දිනය දවසේ ඉදිරිපත් කරන අංගයේ ගුරුවරියකගේ චරිතය රඟ දැක්වීමට මා හට අවස්ථාව ලැබිය. හරිම හොඳයි හැම බබාම ගිතයට රංගනයක් ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලැබුණි. එයට සරිලන සාරියක් අම්මාගෙන් ඉල්ලාගත් මා එයද ඇදගෙන 7 ශ්‍රේණියේ සහෝදරියන් සමඟ රංගනයේ යෙදුණු අවස්ථාව මතකයට නැගේ සියලුම ගුරු මෑණිවරුන් හා ගුරු පියවරුන් මාගේ රංගන කුසලතාවය අගය කලා. එය මටත් සතුටට කාරණයක් විය.

ගුරු දිනයට පෙර දින සැරසිලි කටයුතු කිරීම රාත්‍රිය 12 වන තෙක් පමණ පාසලේ රැදි සිටිමින් පුහුණුවීම් වල නිරත වු අයුරු මතකයට නැගේ. ශ්‍රවණාගාරයේ වේදිකාව මත හිදගෙන තිලක් අංකල් හා එක්ව සැරසිලි එල්ලා නිමකර දෙමාපියන් සමඟ ගෙදර ගියේ. එළඹෙන හෙට දිනට සාර්ථකව මුහුණ දිමටය. ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලය ලෙසට අපට හමුවු පළමු අභියෝගය මෙය වු අතර එය සාර්ථක අන්දමින් සිදු කිරීමට අප 6 දෙනාට හැකිවිය. යම් යම් අඩුපාඩු ගුරුමෑණිවරු ගුරුපියවරු අපට පෙන්වා දුන්නේය. ඊළඟට සිදු කරන්නාවු උත්සව වල එම අඩුපාඩු නොතිබිමට වගබලා ගන්නට අදිටන් කර ගත්තෙමු.

මීළඟ පාසලේ ප්‍රධාන උත්සවයක් වන ක්‍රීඩා උත්සවය සංවිධානය කිරීමට ක්‍රිඩා නායිකාවන් වු අප සිව්දෙනාට පැවරිණි. තෙනායා සහා ප්‍රිමාලි දෙදෙනාද මීට සහභාගි විය. බොහෝ වැඩ කටයුතු කිරීමට සිදුවුයේ අප සිව් දෙනයාටය ක්‍රීඩා උත්සවයට අවශ්‍ය බඩු මිලදි ගැනිමට මහනුවර නගරයට යාමටද අපට සිදු වුණා. පුංචි පුංචි කඩවල් වලින් කඩචෝරු කකා උත්සවයට අවශ්‍ය කරන බඩු ගන්න ටවුම පුරා හතර දෙනා ඇවිද්ද හැටි මට මතකයට නැගෙන තවත් එක් ආදරණිය මතකයක්. සමහර වැඩ වෙලාවට ඉවර කරගන්න බැරි වුණහම පිවන්ති මැඩම් අපිට ටිකක් සැර වුණා. ඒත් අපි 4 දෙනා එකතු වු නිසා කොච්චර වැඩ වැඩි වුණාත් ඒවා කළමණාකරණය කරගන්නට අපිට පුළුවන් වුණා කොහොම කොම හරි ක්‍රිඩා උත්සවයට අවශ්‍ය සියලු දේවල් ලෑස්ති කරගත්තා. අපේ ක්‍රීඩා උත්සවයේ ඒකල තරඟ තිබුනේ දිගන ක්‍රිඩාංගනයේ ඉතින් ඒක අපිට ලොකු අත්දැකිමක් වෙනසක් වුණා. අපේ ක්‍රීඩා උත්සවයට ලහිනි අක්කිත්,කෞෂල්‍යා අක්කිත් අක්කිලා දෙන්නා ගොඩාක් උදව් කළා. අක්කිලා දෙන්නාත් අපි එක්ක දිගන යන්න ආවා. ඒ දවස් අපිට අමතක නොවන ලස්සන දවස් ටිකක්.දිගන ක්‍රිඩාගනයේ තිබුණ තරඟාවලින් බෙහෝමයක් ජයග්‍රහණය කිරීමට සංඝමිත්තා නිවාසය සමත් වුණා. වැඩ ටික ඔක්කොම ඉවර කරලා සතුටින් ආපහු ඉස්කෝලෙටත් ඇවිල්ලා තමයි අපි ගෙදර ගියේ. තරඟ කිහිපයක් ඉවර වුණාට තාමත් තරඟ එහෙමම ඒ අතරතුර කලා උළෙලත් කරන්න අපිට සිදු වුණා. කලා උළෙලේ නිවේදන කටයුතු කරන්නට මාව අපේ මාධ්‍ය සංසදය භාර ගුරුමෑණිය වන ලක්ෂිකා මැඩම් තොරාගෙන තිබුණා. ඒකත් මං ගොඩාක් අසාවෙන් භාරගත්තා. කලා උළෙලේ ආරාධිත අමුත්තෝ විදිහට ආවේ ශ්‍රියන්ත මෙන්ඩිස් මහතා , කුසුම් රේණු මහත්මිය ,සුරාජ් මාපා මහතා ,දුලංග සම්පත් මහතා යන අය පැමිණ සිටියා. සුරාජ්මාපා එකක් චායා රූපයක් ගන්න ඔන්න මට ඒ අවස්ථාව ලැබුණා. එදා නිවේදන කටයුතු කරහම වෙදාටත් වඩා ලොකු ප්‍රතිචාර ගොඩාක් ලැබුණා. මට මැඩම් නිසා තමයි මට ඒ හැම දේම ලැබුණේ. කලා උළෙල ඉවර වෙලා මමයි කිමුතුයි දෙන්නම ගියේ විතේරලාගේ ගෙදර එහෙට යන්න වුණේ පහුවදා පවත්වන තරඟ වලට ඕනේ කරන බඩු භාණ්ඩ අයදුම් පත්‍ර ආදිය හදාගන්න මං යළුවාගේ ගෙදරක නතර වුණ දෙවැනි පාර තමයි මේ ... තාත්තා

ගෙදර එන්නේ සති 2කකට සැරයක් වගේ නිසා මං අම්මා එක්ක තමයි ඉන්නේ එදා මේ වැඩ ගොඩ නිසා යාළුවාගේ ගෙදර යන්න මට අම්මාගෙන් අවසර ලැබුණා. පාන්දර වෙනකම් නිති නැතුව පොත් හැදුවා මතකයි පාන්දර 2කට විතර නින්දට ගියත් අයේ 5ට විතර චිතේරා අපිව ඇහැරෙව්වා. රෑ එළිවෙනකම් කොහොම කොහොම හරි වාඩ ටික ඉවර කරා අපි එකතුවෙලා උදේම නැගිටලා ලෑස්ති වුණා. යන්න. චිතේරාගේ අම්මා අපිට රසට කෑම හදලා තිබුණා. කෑම කාලා අපි යන්න පිටත් වුණා. ඉස්කෝලෙට ගිහින් බඩු ඔක්කොම අපේ බස් රථයෙන් ආයෙත් දිගන ක්‍රිඩාංගනයට ගෙන ගියා. ඒදා වගේම තරඟ කටයුතු සාර්ථකව පවත්වාගන්න අපිට පුළුවන් වුණා. ඒ ඔක්කොම ඉවර කරලා ආයෙත් ඉස්කෝලේට ඇවිත් තමයි අපි හැමෝම දවල් කෑම කෑවේ. එතකොට වේලාව හවස 5ත් පහුවෙලා. තිබුණේ තරඟ ටික ඉවර වුණාත් ක්‍රීඩා උත්සවයේ තව වැඩ ටිකක් ඉතුරු වෙලා තිබුණා. අපිට කරන්න ඒවාත් හෙමින් හෙමින් කරලා ඉවර කරන්න ඕනේ නිසා අපි වැඩ බෙදාගත්තා. ක්‍රීඩා උත්සවයත් ලං වුණා. පෙරහුරුව පැවැත්වූ දිනයේ අඩුපාඩු හොයලා බලලා එකතු වෙලා ඔක්කොම හරියට ඉවර කළා. අපි එදා ගෙදර ගියාට අපි කවුරුත් නිදි නෑ. මොකද හෙට අපිට ලොකු ලස්සන දවසක්. මොකක් හරි අඩුවක් ඇති වෙයිද කියලා අපිට හිතුනා ඒත් එහෙම කිසිම අඩුපාඩුවක් වෙන්න අපි ඉඩ තිබ්බේ නෑ.

ක්‍රීඩා උත්සවයේ වැඩ කටයුතු සියල්ලම සාර්ථකව කෙරුණා ශිෂ්‍යනායිකාවන්ට තිබුණ තරඟයේ දි අපි 6 දෙනා ආයෙත් අපේ නිවාස වලට ගිහින් නිවාස වෙනුවෙන් තරඟ කලා. ආයෙත් නිවාසයට යන්න පුළුන් විම සුන්දර අවස්ථාවක් වුණා. කෙසේ නමුදු ක්‍රිඩා උත්සවය අති උත්කර්ෂවත් අයුරින් වෙලාවටම නිමකිරිමට හැකි වුණා.

ශිෂය නායිකාවන්ට පුහුණු වැඩසටහනකට යන්නට ලැබිමත් සුවිශේෂි අවස්ථාවක් වුවද එදා අපි 6 දෙනාම නම් ගියේ නෑ. ප්‍රිමාලි විශ්මි දෙන්නට යන්න බැරි වුණා. ඒ දෙන්නාව ගොඩාක් මතක් වුණා. අපිට ඒත් අපි 4 දෙනාත් අනිත් අයද කණිෂ්ඨ සහෝදරියන්ද අපි හා එක්වුණා.මේ ගමනෙන් අපි තුළ එකමුතු කම තවත් වැඩි වුණා. මේ ගමනින් පස්සේ ගොඩාක් දේවල් ඉගෙන ගත්තා.

මීළඟට අවුරුදු උත්සවය සංවිධානය කරන්නට අපිට ලැබුණා. අපි 6 දෙනා එකතු වෙලා අවශ්‍ය සැලසුම් හදලා නිවාස මට්ටමින් වැඩ භාරදිලා අපිත් බෙදිලා වැඩ වලට සහය ලබා දුන්නා.

අපේ අක්කිලාට වගේම අපිටත් අවුරුදු උත්සවයට ඔසරියක් අදින්නට අවස්ථාව ලැබුණා. මට නම් සාරියක් තෝරන්නට ගොඩාක් දවස් ගියා.හැබැයි මේ අවුරුදු උත්සවයට හරිම ආසාවෙන් තමයි අපි හැමෝම සහභාගි වුනේ අපේ අක්කිලා එක්ක කඹ ඇද්දා වගේ අපිත් නංගිලා එක්ක කඹ ඇද්දා හැබැයි දින්නේ අපේ නංගිලා කොහොමින් කොහොම හරි අවුරුදු උත්සවයත් අපි 6 දෙනා ලස්සනට සැලසුම් කරලා අනිත් අයත් එක්ක එකතු වෙලා ඉවර කලා.

ඊලඟට අපිට හම්බ වුණේ ගොඩාක් ලොකු භාරධූර වගකිමක් ඒ තමයි Covid 19 වසංගත තත්වය නිසා කල් ගියපු අවුරුදු 3ක ත්‍යාග ප්‍රධානෝත්සවයක් හා අවුරුදු 3 වර්ණ ප්‍රධානෝත්සවයත් සංවිධානය කිරිම,

මං මුලින්ම වර්ණ ප්‍රධාන උත්සවයකට සහභාගි වු දිනය මට මතක් වුණා. එදා අලුත්ම නිල ඇඳුමක් ඇඳලා අක්කිලා නම කියන කොට වේදිකාවට නැගලා සහතිකය ලබාගන්ත විදිහ මතකයට නැගේ එදා එහෙම ලස්සනට වාඩි වෙලා හිටපු මට සහතිකය ලබා දෙන්න ඒ කලේ හිටපු ශිෂ්‍ය නායිකාවන් කොයිතරම් වෙහෙස වෙන්න ඇත්ද කියලත් අපි හිතනවාට වැඩිය දිගු ක්‍රියාවලියක් බවත් මට තේරුම් ගියේ මේ උත්සවය සංවිධානය කරන කොට ඇත්තටම කිව්වොත් ඒක ලොකු වගකීමක්. හරි කෙනාට හරි තෑග්ග ලැබෙන්නටත් ඒවා මාරු නොවන්නටත් අපි වග බලාගන්න ඕනේ. මේ උත්සව දෙකටම සැරසිලි විශාල

ප්‍රමාණයන් අවශ්‍ය වුණා. විශේෂයෙන් වර්ණ ප්‍රධාන උත්සවයට වැඩි ප්‍රමාණයක් ඕනේ වුණා. ඒ හැම සැරසිල්ලක්ම අපි රෑයක් දහවලක් නැතුව හැදුවා. අපිට වඩා අවුරුදු 3ක් වැඩිමහල් අක්කිලාගේ  වර්ණ ප්‍රධාන උත්සවයක් හා ත්‍යාග ප්‍රධාන උත්සවයක් නිසා  කලින් ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ හිටපු අක්කිලා ගොඩාක් මේ වැඩ වලට සම්බන්ධ වුණා. වැඩ පරක්කු වෙන කොට වැඩ අතපසු වෙන කොට අක්කිලා අපිට ගොඩාක් සැර වුණා. ඉස්කෝලේ තියෙන අනෙක් පොඩි පොඩි උත්සව වලටත් සහය දෙන්න  අපිට සිද්ධ වුණා. ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය විදිහට ඒ හැම දේම කරන ගමන් තමයි මේ උත්සව දෙකේ වැඩ බැලුවේ. ත්‍යාග ප්‍රදාන උත්සය කෙමෙන් කෙමෙන් ලඟා වුණා. වැඩ ඔක්කොම බෙදා ගත්ත විදිහට ඉවර කරගන්න  අපිට පුළුවන් වුණා. ත්‍යාග ප්‍රධාන උත්සවය හරිම අභිමානවත් විදිහට කර ගන්න අපිට අවස්ථාව ලැබුණා. අක්කිලා එදා අපේ වැඩ ගැන ගොඩාක් අගය කළා.  "ත්‍යාග ප්‍රධානෝත්සවය  ඉවර වුණාට  වර්ණ ප්‍රධාන උත්සවය ඉවර නෑ තව වැඩ තියෙනවා" අක්කිලා කියුවේ එහෙම. ඒකට අවශ්‍ය කරන වැඩ කටයුතු ඔක්කොම දිවා රෑ නොබලා අපි කරා. වර්ණ ප්‍රධාන උත්සවයත් අභිමානවත් අයුරින් විද්‍යාලියිය ශ්‍රවණාගාරයේ දි පැවැත්වුණා. අපි එකත් සාර්ථකව නිම කළා. මේ විදිහට කාලය කෙමෙන් කෙමෙන් ගෙවිලා ගියා. මේ දවස් ටිකේනම් පංතිය පැත්තටවත් යන්න බැරි වුණා. උදේම පංතියට දුවලා ගිහින් අපේ මැඩම්ගේ ලස්සන මුණ බලලා "මං ආවා මැඩම්" කියාලා අයෙත් ක්‍රීඩා පිටියට දුවගෙන එන්න අපි පුරුදු වෙලා හිටියා. එතරම් ලොකු වැඩක් නොතිබුණත් සමහරදාට අපි පුරුද්දක් විදිහටම කිව්වා.මැඩම් ඒක දැනන් හිටියා. වැඩ නැතුව එළියට වෙලා ඉඳලා අහුවුණාම බැණුම් අහලා පංතියට යනකොට යළුවෝ අපි දිහා බලන් ඉන්නවා. "අයේ එහෙම කරන් නෑ  මැඩම් හෙට ඉඳන් පංතියට එනවා" කියලා පොරොන්දු වුණත් හෙට පංතියට යන්න පුළුවන් වෙයි ද කියලා අපේ හිත අපෙන්ම අහනවා. ඊළඟට අපිට ලැබුණේ අක්කිලාගේ සෝෂල් එක සංවිධානය කරන්න මේකේ තේමාව වුණේ 60 70 දශකයේ හින්දි සිනමාව හා ලංකාවේ සිනමාව කියන එක. ඉතිං ඒකට අවශ්‍ය දෙවල් වලට අපි අක්කිලාට උදව් කළා. අක්කිලා වෙනුවෙන් වත්මන් ශිෂ්‍ය නායිකා මණ්ඩලය නර්ථනයක් ඉදිරිපත් කරන්න ඕනේ කියලා අපිට අක්කිලා කිව්වා. ඒක නම් අපිට ටිකක් අභියෝගාත්මක වුණා. මොකද හැමෝම නර්ථනය හදාරලා තිබුණේ නෑ. නර්ථන කණ්ඩායමේ හිටපු කිහිප දෙනෙක් අපේ ශිෂ්‍යනායිකා මණ්ඩලයේ හිටපු නිසා වැඩේ හරි ගියා. එයාලා එකතු වෙලා නැටුම  හැදුවා ඒක නටන් තමයි අමාරු වුණා. එයාලට නම් ලේසි අපිට තමයි අමාරු වුණේ. ටික දවසත් එක දිගට වැඩේ කරන් යන කොට ඒතරම් අමාරු වුනේ නෑ. අපේ ප්‍රිමාලි තමයි ලස්සනටම නැටුවේ. නැටුම් කරන අයටත් වඩා ලස්සනට එයා නැටුව පළවෙනි පේළියේ ඉදන්ම මේ හැම දේම අපිට ගොඩාක් සුන්දර මතකයන් වුණා. සෝෂල් එකත් ලස්සනටම වුණා අපි එදා සාරි ඇන්දා අක්කිලා වගේම අපේ අක්කිලාත් හරිම ලස්සනට හිටියා එදාත් අනත් වැඩටිකත් අපි එකතු වෙලා ලස්සනට ඉවර කළා. ක්‍රීඩා නායිකාවක් වශයෙන් නැතිනම් ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයේ සමාජිකාවක් විදිහට අපිට හම්බවුණ අන්තිම අවස්ථාව තමයි මේ ඒ තමයි මහාමායාවේ ප්‍රථම වතාවට ක්‍රිකට් මහා සංග්‍රමයක් නැති නම් බිග් මැච් එකක් සංවිධානය කරන්නට අවස්ථාව ලැබිම. මහාමායා ඉතිහාසයේ ප්‍රථම වතාවටයි මෙවන් තරඟයක් සංවිධානය කරේ ඒ නිසා අන්තිම වැඩේ අපිට ගොඩාක් අභියෝගාත්මක වුණා. ශාන්ත අන්තෝනි විද්‍යාලය සමඟ  ඒ කණ්ඩායමේ ජාතික මට්ටමේ ක්‍රිඩිකාවන් කිහිප දෙනෙක්ම සිටි නිසා එයාලා කිසිම බයක් නැතුව අපිත් එක තරඟ කරන් සුදානම් වුණා. අපේ කණ්ඩායමේ නායිකාව හා තවත් එක් අයෙක් විතරයි ජාතික මට්ටමේ තරඟ කාරියන් වුණේ. අනිත් අය වයසින් ටිකක් අඩු අය වුණා. කොහොම වුණත් අපි දිනන්න ඕනේ කියන ලොකු බලාපොරොත්තුව හිතේ තියාගෙන අපි 6 දෙනාත් වැඩ වලට එකතු වුණා. කෙහොමහරි අපි දිනන්න ඕනේ කියන අරමුණ විතරයි අපිට තිබුණේ. අපේ කණ්ඩායමට දිනන්න අවශ්‍ය හැම දෙයක්ම  ඔවුන්ට ලබාදෙන්නට අපි අදිටන් කරගත්තා.

ශූරතා පිලිහ හදන්න දෙන්න කොඩි මහන්න දෙන්න වගේ තවත් බොහෝ වැඩ අපිට මෙහි දි පැවරුණා. ආරධිතයන්ට ආරධානා පත්‍ර යවන්නටත් පාසල් වල විදුහල්පතිවරුන්ට ආරධනා පත්‍ර යැවිමටත් අපිට අවස්ථාව ලැබුණා. ඒ හැමදේමටම අපි අපේ පිවන්ති මැඩම්ට සහය දුන්නා. ප්‍රථම වතාවට මෙවන් තරඟයක් සංවිධානය කළ බැවින් අප මහාමායාවියන්ගේ විනය පිළිබඳව අප වැඩි වශයෙන් බලන්නට සිද්ධ වුණා. ඒ සඳහා අපි පුහුණු ශිෂ්‍ය නායිකාවන් පත් කළා. ඒවගේ පාසලේ ඉගෙන ගන්න සෑම සහෝදරියක්ම පාසල් නිල ඇදුමෙන් ක්‍රිඩාංගනය වෙත ගෙනයාමට අපි කටයතු කළා. කෙමෙන් කෙමෙන් ඒ දවසත් ළං වුණා.

"වැඩ ඔක්කෝම බැලුවා නේද ළමයි " පිවන්ති මැඩම් අපෙන් ඇහුවා "දිනෙත්මි... සිරිපාල මැඩම් එක්ක පල්ලේකැලේ ගිහින් එන්න"ඔයා එනකම් අනිත් අය මේ වැඩ ටික බලයි ඉක්මණට ගිහින් එන්න. නෙතායා ප්‍රිමලි දෙන්නාත් ඉන්නවානම් එක්කන් යන්න. "හරි මැඩම්" එදා අපි 3න් දෙනාට යන්න වුනේ කිමුතු ,විශ්මි,විතේරා 3 දෙනාව ඉස්කෝලේ දාලා අපි 3 දෙනාම ගිහින් මැඩම්ලා සර්ලා එක්ක වැඩ ටික හරිද කියලා බලලා අයෙත් ඉස්කෝලේට එන්න පිටත් වුණා. පල්ලකැලේ තියෙන සියඹලාගස්යට වැටිලා තිබුණ සියඹලා අහුලාගෙන කන්නටත් අපි අමතක කලේ නෑ. නිශාන්ත අංකලල් තමයි එදා අපිව එක්කන් ගියේ. ඉස්කෝලේට යන ගමන් අපි කතා වුණා අයිස්ක්‍රිම් කන්න ඕනේ කියලා. මැඩම්ගෙන් අවසර ලැබුණා ඒකට "අංකල්..... අපිට අයිස්ක්‍රිම් කන්න ඕනේ පුළුවන් තැනක නතර කරන්නකෝ" අපි අංකල්ට කියුව්වා. අංකල් තකඩයක් ලඟ නතර කරල අපිට අයිස්ක්‍රිම් අරන් දුන්නා. අව්වේ ඉඳලා ඉඳලා මහන්සි වෙලා හිටිය නිසා හැමෝම අයිස්ක්‍රිම් කෑවේ සතුටින් අයිස්ක්‍රිම් කෑව නිසා මහන්සිය ටිකක් අඩු වුණාදෝ කියලා හිතුනා. එදානම් කොච්චර මහන්සි වුණාත් අපි හිතුවේ හෙට දවස අපේ දවස වෙනවාමයි කියලා.

ඉතිහාසයේ ප්‍රථම වතාවට මහාමායාවියන් නව පෙරළියකට සුදානම් වුණු ඒ අපුරු දවසත් උදාවුණා තරඟවලිය පැවැත්විමට සියලු කටයුතු සුදානම් කරලයි තිබුණේ.සියලුම දෙනා ප්‍රිති ඝෝෂා කරද්දි ක්‍රීඩාංගනය වෙත ශූරතා පළිහ රැගෙන ගිය ඒ අවස්ථාව මා මතකයට නැගේ එදා ශූරතාපළිහ අරන් ගියේ කිමුතු අපි 3 දෙනාත් ගියා කිමුතු එක්කම කිමුතු අරන "ආවා ශූරතා පළිහ අපිම ආයේ ස්කෝලේට අරන් යන්න ඕනේ කියන හැගඅම අපිට තිබුණා. ශාන්තා අන්තෝනියන් ඉතා උද්යෝගයෙන් තරඟයට සුදානම් වන අයුරු පෙනුනා. කෙසේ නමුදු තරඟය ආරම්භ වුණා. මං මුලින්ම ක්‍රිකට් තරඟයක් බැලුවේ එදා ගොඩාක් අය එහෙම තමා.

ලස්සන දවසක් ගෙවී ගියා තරඟය නිමා වෙන්නට තව සුලු මොහොතයි "තරඟයේ සමස්ථ ශූරතාව දිනාගන්නේ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයයි උණුසුම් සුභ පැතුම් ඔබට " එසේ ලබාදුන් නිවේදනය තවමත් මටනම් දෝංකාර දෙමින් ඇහෙනවා වගේ දැනෙනවා. ඔව් එදා දිනුවේ අපි තමයි. ඉසිරි මිගම්මන සොයුරියගේ නායකත්වය හා නිවැරදි මඟ පෙන්විම නිසා තරඟය ජය ගන්නට අපිට හැකියාව ලැබුණා. හිතුවා වගේම අපි අරන් ආව ශූරතාපළිහ අපිම අරන් ගියා මහාමායාවට එදා අපි හැමෝම හිටියේ හරිම සතුටින්. අපි 6 දෙනාට හම්බ වුණ අන්තිම වැඩේත් අපි 6 දෙනා හරියටම කළා කිව්වොත් මම හරි.

ලොකු වගකිම් ගොඩාක් මේ තනතුරත් එක්ක අපිට ලැබුණේ ඒ හැම දෙයක්ම අපි 6 දෙනාගේ එකමුතුකම සහයෝගය නිසා තමයි සාර්ථක වුණේ

මගේ පාසල් ජිවිතයේ මට හම්බවුණ ආදරණියම පවුලක් තමයි ප්‍රධාන ශිෂ්‍යනායිකා මණ්ඩලයේ අනිත් 5 දෙනා.

නෙතායා....,ප්‍රිමාලි.....කිමුතු....විතේරා......විශ්මි.... "අපි දිනුවා."

ඔව් අපි දිනුවා!

# ධුරකාලයේ නිමාව හා පාසල් දිවියේ අවසන් දින කිහිපය.

ක්‍රිකට් සංග්‍රමයෙන් පස්සේ අපි තීරණය කරා අපේ කණිෂ්ඨ සහෝදරියන්ට තනතුරු ප්‍රධානය කරන ඕනේ කියලා. විභාගයත් ළඟ ළඟ එන නිසා තනතුරු ප්‍රධානය ඉක්මන් කරන්න හිතුවා. අපි අපේ ශිෂ්‍ය නායිකා මණ්ඩලය භාරව ඉන්න නදිරා මැඩම්ව දැනුවත් කරලා උත්සවය ටිකක් ඉක්මණින් පවත්වන්න තීරණය කරා. කණිෂ්ඨ සහෝදරියන්ගේ සම්මුඛ පරීක්ෂණය තියලා ඔවුන්ගෙන් සුදුසු අයට තනතුරු ප්‍රධානය කරා. අවසන් තීරණය ලබා දෙන්නේ විද්‍යාලිය ගරු විදුහල්පතිතුමියයි. නිවාස මට්ටමින් ද සම්මුඛ පරීක්ෂණ පවත්වා නිවාස වල තනතුරුද ප්‍රදානය කරන්න තීරණය කරලා තිබුණා.

නිල ලාංජන පැළඳ වීමේ උත්සවය තමයි අපි ප්‍රධාන ශිෂ්‍ය නායිකා මණ්ඩලය ලෙස සහභාගි වුණු අන්තිම උත්සවය.

එදා හරිම ලස්සන දවසක්... අපි 6 දෙනාම හිටියේ සතුටයි දුකයි අතර මැද තත්වයක කියලයි මට හිතෙන්නේ.

අපේ නෙතායා කවදාවත් අඬනවා මම දැකලා තිබ්බේ නෑ අපි අඬනකොට අපිව සනසවපු අපිට දිරිමත් කරපු නෙතායාගේ ඇස් වලත් එදා කඳුලු පිරිලා... අපේ ප්‍රිමාලිත් රතු වෙලා....කිමුතුත් හොඳටම අඩනවා ..... විතේරා විශ්මි දෙනත් බලාගත්තු අත බලන් ලොකු කල්පනාවක ... මටත් දරාගන්න බැරිතරම් ලොකු දුකක් ඒ වේලාවේ දැනුනා. නොදැනිම මගේ ඇසිනුත් කඳුළු ගලන්නට වුණා.

අපි 6 දෙනා ආයේ කවදා හමුවේද කියන ප්‍රශ්නාර්ථය අපිට තිබුණා. ආයේ එකට වැඩ කතරන්න එකට කන්න බොන්න අපේ කතා කියන්න ආයේ දවසක් එයිදෝ කියලා හිතුනා.

අවුරුදු 2ක් විතර එකම පවුලක් වගේ ඉඳලා වෙන් වෙන කොට දැනේන ඒ දුක කියලා නිම කරන බෑ. හිසේ තියන් හිටිය ලොකු බරක් අපෙන් ගිලිහුණාදෝ කියලා එදා හිතුණා.

කදුළු පිරි දෙනෙතින් නව ශිෂ්‍යනායිකා මණ්ඩලයට සුභ පතමින් අපේ සියලු වගකිම් ඔවුනට පැවරුවා. අපිට වඩා ඔවුන් කටයුතු සංවිධානය කරමින් වගකිම් හා යුතුකම් නොපිරිහෙළා ඉටු කරයි යන හැඟිමෙන් යුතුව ධුර කාලය නිමා කලේ ඉතාමත් සෙනෙහසිනි.

ධුර කාලය නිමාවත් සමඟ පාසල් එමට සිදුවුයේ වාර විභාගය සඳහායි වෙනදා වගේම උදේට නැගිටලා නිල ඇදුම ඇඳලා බැජ් එක ගහලා එන්න ලැස්ති වුණත් ටිකකින් මතක් වුණා අපිට ආයේ බැජ් එක ගහන්න බැනේ කියලා... කඳුලු පිරි දෙනෙතින් සුන්දර මතක ගොන්නක් ක්ෂණිකව සිහිපත් කරමින් බැජය මගේ බ්ලේසරයේ පන්දා පාසල් ආව දිනය මගේ මතකයේ රැදි තිබෙන තවත් අපුරු දවසකි. අපිට නිල ඇඳුමේ ඉතිරි වුණේ පුහුණු ශිෂ්‍ය නායිකාවක් ලෙස පැළදි බැජය නිසා සිරස් අතට නිල ඇදුමේ වු සිදුරු 2කත් පසුව තිරස් අතට ගැසු බැජ්යේ සිදුරු 2කත් පමණි. නිළ ඇදුමේ කරට ටිකක් පහළින් ඇති මේ පුංචි සිදුරු ටික අපේ මතකයන් නැවත නැවතත් ඒ කාලයට රැගෙන යනවා නොවනු මානයි. මේ ගෙවියන්නේ පාසල් කාලයේ අවසන් දින කිහිපයයි. පාසලේ අවසාන් වාර විභාගය මේ දිනවල පැවැත්වෙනවා.

වාර විභාගය කියන වචනයටවත් කැමැති නැති අපි දැන් ඒ වචනයටත් ගොඩාක් ආදරේ වෙලා ඒ ඇයි දන්නවාද වාර විභාගය නිසා අයෙත් ටික දවසක් හරි ඉස්කෝලේ යන්න පුළුවන් නිසා දෙසැම්බර් 22 නිදා පාසලේ නිවාඩු ලබා දෙනවා වගේම අ.පො.ස උසස් පෙළ විභාගය සඳහා අයදුම් පත්‍ර ලබා දෙනවා. ජනවාරි මාසයෙන් පස්සේ අපි මහාමායාවේ අදි ශිෂ්‍යාවන් බවට පත් වෙනවා. කියාගන්න බැරි තරම් දුකක් තමයි මගේ හිතේ දැන් තියෙන්නේ මෙච්චර ලොකු මතක ගොඩක් එක්ක තියෙන සුන්දර කාලයක නිමාවක් දකින්නේ කෙහොම කියලා හිතෙනවා. ඉස්කෝලේ කාලේ වටිනාකම ඒ කාලේ සුන්දරත්වය ගැන කියන්නට මට වචන මදි.

මේ ලෝකේ තියෙන තැන්වලින් මං යන්න ආසම තැන තමයි ඉස්කෝලේ.... මගේ ගෙදර තමයි මේ ඉස්කෝලේ.... ආයේ කවදාවත්ම යන්න බැරි ඒ ආදරණීය මතකයන් පිරුණි සුදු කොටුකර තියෙන ගවුමටයි නිල්පාට බකල් එකටයි මං මගේ හදවතින්ම ගොඩාක් ආදරේයි.....

මතකයන් හිත පරවයි.....

වසන්නේ කෙහෙදෝ ගිහින් ......

පිවිතේ තැනක නැවතිලා.......

මැකි යයි පිය සටහන් පාසලෙන්....

ලැබුණොතින් වරමක් ඉල්ලනවා ආයෙත් ඒ ගෙවුණු සුන්දර වසර 13 .

නිමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01